Sri Lanka Judges Institute

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

*යුක්තියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා කැපවීමෙ*

# වාර්ෂික වාර්තාව

## 2013.12.31 දිනට අවසන් වසර සඳහා

## වාර්ෂික වාර්තාව

1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10 වන වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

# පටුන


| | | |
|---|---|---|
| 1. | දැක්ම/මෙහෙවර........................................................................ | 3,4 |
| 2 | අධ්‍යක්ෂකවරයාගේ ප්‍රකාශය ........................................................... | 5,6 |
| 3. | ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිළිබඳව................................ | 7 |
| 4. | ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීම................................. | 8 |
| 5. | ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ඉතිහාසය........................... | 8-16 |
| 6. | ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය | 16-19 |
| 7. | ආයතනයේ අරමුදල්........................................................................... | 20 |
| 8. | පුහුණු වැඩසටහන්............................................................................. | 20-29 |
| 9. | 2013 වසර දෙස ආපසු හැරී බලමු.......................................................... | 30 |
| 10. | 2013 වර්ෂය තුලදී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්යයන් ............ | 31-33 |
| 11. | ආරාධිත දේශන.................................................................................. | 34 |
| 12. | පර්යේෂණ කාර්යයන්............................................................................ | 35-38 |
| 13. | අන්තර්ජාතික සහයෝගීතාව.................................................................. | 38-39 |
| 14. | අනාගත පාඨමාලා............................................................................. | 40 |
| 15. | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති..................................................... | 40 |
| 16. | සුභාශිංසනය.................................................................................... | 40 |
| 17. | ශේෂ පත්‍රය....................................................................................... | 41 |
| 18. | ආදායම් හා වියදම් ගිනුම ........................................................... | 42 |
| 19. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය............................................................................. | 43-47 |
| 20. | ස්ථාවර වත්කම්..................................................................................... | 47 |
| 21. | 2013 වර්ෂය සඳහා විගණකාධිපතිතුමාගේ වාර්තාව......................................... | 48-51 |

# දැක්ම

**විශ්වාසවන්ත, අපක්ෂපාතී, ස්වාධීන, භාවිතා කරන්නාට පහසු සියලු දෙනාට ප්‍රවේශ විය හැකි නිති ක්‍රමමයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් විනිශ්චයකාරවරුන්ගේ වෘත්තිය විශේෂඥතාව ඉහල නැංවීම සඳහාත් සහ ඔවුන්ගේ දැනුම උසස් මට්ටමකට රැගෙන ඒම සඳහාත් විනිශ්චයකාරවරුන්ට වඩාත් ඉහළ මට්ටමේ පුහුණුවක් සහ පර්යේෂණ පහසුකම් සපයා දෙමින් අධිකරණ කටයුතු පුහුණු කිරීම සඳහා වූ විශිෂ්ඨතම ආයතනයක් වශයෙන් සේවය සැපයීම.**

# මෙහෙවර

**විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් තුලින් අධිකරණ නිලධාරින්ගේ වෘත්තිය විශේෂඥතාව සහ නිතියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අධිකරණ නිලධාරීන් වෙත උසස් මට්ටමේ දැනුම සපයාදීම සහ හැකියාවන් ඉහළ නැංවීම මගින් අපගේ දර්ශනය මුදුන් පමුණුවා ගැනීම උදෙසා කටයුතු කිරීම.**

## 2. අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට අවසන් මූල්‍ය වර්ෂය සඳහා අප ආයතනයේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද අවසාන ගිනුම් ඔබ වෙත පිළි ගන්වමි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මෙහෙයුම් කටයුතු අපේක්ෂිත ඉලක්ක සහ මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ කෙටි හැඳින්වීමක් මෙම වාර්ෂික වාර්තාව මගින් නිරූපනය කෙරේ.

තවද පසුගිය වර්ෂය තුලදී වඩාත් සඵලදායී ආකාරයෙන් අප ආයතනය විසින් ඉහත සඳහන් පරමාර්ථයන් මුදුන් පමුණුවා ගත්තේ කෙසේද යන්න පිළිබඳවද මෙම වාර්තාව මගින් පිළිඹිමු වේ.

1986 වර්ෂයේ පාර්ලිමේන්තු පනතක් මගින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටවූ දින සිට දිගුකාලයක් තිස්සේ විනිසුරුවරුන්ගේ වෘත්තිය සංවර්ධනය සඳහා මෙන්ම ඔවුන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා වූ අධිකරණ පුහුණු කටයුතු අඛන්ඩවම පවත්වාගෙන එනු ලැබේ.ආයතනයේ අධ්‍යයන කටයුතු සහ පර්යේෂණ කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා සහ විනිසුරුවරුන්ගේ වෘත්තිය විශේෂඥතාව ඉහළ නැංවීමට සහ යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියේදී ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුනෙන් අධිකරණ නිලධාරීන්ට පුහුණුව සහ අනෙකුත් පහසුකම් සැලසීම සම්බන්ධයෙන් කැපී පෙනෙන සේවා සපයන්නකු වශයෙන් අප වැදගත් කාර්යභාරයක් ඉටු කළ නිසා 2013 වර්ෂය ශ්‍රී ලංකා විනිශ්චයකාවරුන්ගේ ආයතනයට වැදගත් වෙනසක් සිදුවූ වර්ෂයක් වශයෙන් සැලකේ.

පහතින් සඳහන් කර ඇති සංවර්ධන අවස්ථා පිළිබව සැලකීමේදී පසුගිය වසර ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයට වැදගත් වසරක් වී ඇත. ඉන් පළමු කාරණය වන්නේ ගරු අගවිනිසුරු ජනාධිපති නීතිඥ මොහාන් පීරිස් මැතිතුමාගේ ඉල්ලීම මත ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ලේකම් කාර්යාලය සඳහා භාවිතා කිරීම පිණිස අධිකරණ අමාත්‍යාංශයට අයත් නව ගොඩනැගිල්ලේ 5 වන මහලෙන් කොටසක් විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වෙත ලබාදීමයි. දෙවන කාරණාව වන්නේ දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව සැළකිය යුතු මට්ටමකින් නැංවීමත් සමඟ 2013 වසර අභියෝගාත්මක වසරක් වීමය. තෙවන කාරණය වන්නේ ගරු අගවිනිසුරුතුමාගේ කාර්යාලය යාපනය මහාධිකරණය සහ තංගල්ල මහාධිකරණය එකිනෙක සම්බන්ධ කරමින් වීඩියෝ සාකච්ඡා පහසුකම් ඇති කිරීම සහ අධිකරණ නිලධාරීන්ට වෙබ් පහසුකම් අත්විඳීමට හැකිවීම් මගින් තාක්ෂණය භාවිතා කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා ඇති කිරීමයි. හතරවන කරුණ නම් ආයතනයේ සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දීම වන අතර, පස්වනුව මහාධිකරණ විනිසුරුවරු, දිස්ත්‍රික් අධිකරණ වල විනිශ්චයකාරවරු මහෙස්ත්‍රාත්වරු මෙන්ම කම්කරු විනිශ්චය සභා සභාපතිවරු පුහුණු කිරීම සඳහා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වෙත උපදේශකවරයකු පත් කර ගැනීමයි.

2013 ජුනි මාසය සිට 2013 දෙසැම්බර් මාසය දක්වා වූ ක්‍රියාකාරි සැලැස්මේ පෙන්වා දී ඇති පරිදි ප්‍රමුඛතා ව්‍යාපාති හඳුනාගනිමින් සහ උපායමාර්ගික ඉලක්ක ක්‍රියාත්මක කරමින් 2013 ජුනි මස සිට දෙසැම්බර්

මාසය දක්වා වු පසුගිය කාල පරිච්ඡේදය තුල ආයතනය විසින් කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

විනිශ්චයකාරවරු සඳහා නෛතික තොරතුරු සහ නිති අධ්‍යාපනික ග්‍රන්ථ ආදිය ලබා දෙමින් වෙබ් ආශ්‍රිත අධ්‍යාපන පහසුකම් සැලසීම, ආයතනයේ ඊ - පුස්තකාලයේ ඇති වාර්තා නොකළ නඩු තීන්දු සහ පාඨමාලා ග්‍රන්ථ ප්‍රසිද්ධ කිරීම, විදේශීය විනිශ්යකාරවරු විසින් ආරාධිත දේශණ පැවැත්වීම, විශ්ව විද්‍යාල ආචාර්යවරු නීති විශාරදයින් සහ අනෙකුත් වෘත්තිකයන් විසින් දේශණ පැවැත්වීම, ශ්‍රී ලංකා විනිශ්වයකාරවරුන්ගේ ආයතනය පහත සංශෝධනය කිරීම, බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියක් සකස් කිරිම, සේවාස්ථ අධිකරණ නිලධාරීන් සඳහා දිගුකාලීන පුහුණු අත්පොතක් සංවර්ධනය කිරීම, විනිසුරුවරු පුහුණු කිරීමේ විදේශීය ආයතන සහ අනෙකුත් අධ්‍යයන ආයතන සමඟ හවුලේ කටයුතු කිරීමට අවස්ථාව උදාකර ගැනීම, අධිකරණ පුහණුව සඳහා වු අන්තර්ජාතික සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම සහ විනිශ්වයකාරවරු සඳහා විදේශ පුහුණු වැඩ සටහන් සංවිධානය කිරිම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් මහාධිකරණ විනිසුරු දිස්ත්‍රික් විනිසුරුවරු, මහෙස්ත්‍රාත්වරු සහ කම්කරු විනිශ්වය සභා සභාපතිවරු සඳහා සේවාස්ථ පුහුණුව ලබාදීමට කටයුතු කරන ලදී.

කෙසේ වුවද, විශේෂයෙන්ම සුදුසකම්ලත් පුස්තකාලාධිපතිවරයකු කාර්මික නිලධරයකු සහ අනෙකුත් සහායක සේවක මණ්ඩල හිඟය හේතුවෙන් ආයතනයේ අධ්‍යයන කටයුතු වලට බාධා පැමිණ තිබේ. එම නිසා අධිකරණ නිලධාරීන් වෙත ඉතා කාර්යක්ෂම සේවාවන් සැලසීම පිණිස 2014 වර්ෂය තුලදී අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීමට ආයතනය විසින් හැකි සෑම පියවරක්ම ගනු ඇත.

කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ගේ සහ අනෙකුත් තැනැත්තන්ගේ සහාය ලැබීම හේතුවෙන් පසුගිය වර්ෂය තුලදී ජයග්‍රහනයන් කිහිපයක් අත්පත් කරගැනිමට හැකියාව ලැබුණි.

පළමුවෙන්ම ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනයේ සභාපති ගරු අගවිනිසුරු ජනාධිපති නීතිඥ මොහාන් පිරිස් මැතිතුමා සහ කළමනාකරණ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් වන ගරු ගාමිණි අමරතුංග මැතිතුමා (2013 අගෝස්තු සිට) සහ ජනාධිපති නීතිඥ ගරු සලීම් මර්සූෆ් මැතිතුමා වෙත මාගේ අවංක ස්තූතිය සහ කෘතඥතාව පළ කර සිටින අතර ඔවුන්ගේ දර්ශනය, අධිෂ්ඨානය සහ මඟ පෙන්වීම නොමැතිව මෙම ජයග්‍රහන කිසිවක් අත්පත් කර ගත නොහැකි වනු ඇත.

තවද, අපගේ උපදේශක වන විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු ගරු රංජිත් රණරාජා මැතිතුමා විසින් ලබාදුන් අඛන්ඩ සහයෝගය ද ඉතාමත් කෘතඥතා පුර්වකව සිහිපත් කරමි. අමතරව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය සහ කාර්ය මණ්ඩලයද විශේෂයෙන්ම පරිපාලන නිලධාරීන් සහ ගණකාධිකාරීවරු විසින් ලබාදුන් අවංක සහයෝගය හා කැපවීම පිළිබඳව විශේෂ ස්තූතිය පිරිනමමි.

මෙම ජයග්‍රහණය අත්පත් කර ගැනීම උදෙසා ආයතනයේ කාර්ය මණ්ඩල විසින් ලබාදුන් සහාය ඉතාමත් අනගීභවනීය බව සඳහන් කරන්නේ හද පිරි සතුටිනි. බොහෝ දුෂ්කරතාවන් මධ්‍යයේ වුවද ඔවුන් ආයතනයේ ඉලක්ක ගත අරමුණු සඵල කර ගැනීම සඳහා මහත් උද්යෝගයෙන් යුතුව තම වගකිම් ඉටු කරන ලදි. ශ්‍රී ලංකා විනිශ්වයකාරවරුන්ගේ ආයතනයේ නිලධාරීන් විසින් දක්වන ලද අඛන්ඩ සහයෝගය සහ අවංක කැපවිම උදෙසා මගේ හද පිරි ප්‍රණාමය පුද කර සිටින අතර ඉදිරි වර්ෂයන්හිද මෙලෙස ශක්තිමත්ව නැගී සිටීමට අදිටන් කර ගනිමු.

රුවන් ප්‍රනාන්දු
එල්.එල්.එම්. (කාඩිෆ්) එක්සත් රාජධානිය, බුද්ධිමය දේපල අයිතිවාසිකම් පිළිබඳ පශ්චාත් නීති
ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා)
මහාධිකරණ විනිසුරු සහ අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා විනිශ්වයාකාරවරයන්ගේ ආයතනය
02.05.2014

# 3. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

පහත සඳහන් ඉලක්ක සපුරා ගැනීම මගින් ස්වකිය මෙහෙවර මුදුන් පමුණුවා ගැනීම, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අපේක්ෂාවයි.

- අධිකරණ නිලධාරීන් සඳහා අඛන්ඩ පුහුණුවක් ලබාදීම ;
- පර්යේෂණ, ප්‍රකාශන සහ තාක්ෂණික සහාය සලකා දෙමින් අධිකරණ නිලධාරීන්ට සහයෝගය ලබාදීම;
- අධිකරණ සහ නීති ගැටලු සම්බන්ධයෙන් අධිකරණ නිලධාරීන් අතර මත හා අදහස් හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම,
- අධිකරණ නිලධාරින්ගේ වෘත්තිය විශේෂඥතාව ඉහළ නැංවීම සහ ඔවුන්ගේ දැනුම හා හැකියාවන් වැඩි දියුණු කර ගැනීම සඳහා සම්මන්ත්‍රණ සමුළු, දේශණ, වැඩ මුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම.
- සිද්ධි කළමනාකරණය සහ සිද්ධි ප්‍රවාහ කළමනාකරණය මගින් ප්‍රමාදය අවම කිරීම සඳහා වූ හොඳම චර්යාවන් වෙත මාර්ගෝපදේෂ සංවර්ධනය කිරීම සඳහා දායක වීම.
- යුක්තිය පසිඳලීමේ විවිධ ප්‍රවේශයන් සම්බන්ධයෙන් පර්යේෂණ කාර්යයන් සිදු කිරිම.
- පුස්තකාල සහ වෙබ් පදනම් වූ අධ්‍යාපනික පහසුකම් සැපයීම සහ නීතිය පිළිබඳ තොරතුරු සහ ග්‍රන්ථ විනිශ්චයකාරවරු අතර බෙදා හැරීම.
- අන්තර්ජාතික අධිකරණ ආයතන සමඟ අන්තර්ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම.
- අධිකරණ පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය නගා සිටුවීම සඳහා නඩු කියන්නන් වෙත සහන සැලසීම මගින් නීති ප්‍රතිසංස්කරණ සඳහා දායක වීම.
- යුක්තිය පසිඳලීම සහ යුක්තිය වෙත ප්‍රෙවිශ වීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රියා පරිපාටි සංවර්ධනය කිරිම සහ ක්‍රියාත්මක කිරීම සඳහා දායක වීම.

## 4. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ස්ථාපිත කිරීම.

විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ “1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිෂ්චයකාරවරුන්ගේ ආයතනය පනත” නම් වූ පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවන ලදී.

### අරමුණු

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමේ අරමුණු පහතින් සඳහන් වේ:

1. අධිකරණ නිලධරයන් විසින් අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් මත සහ අදහස් හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලැස්වීම;
2. අධිකරණ නිලධරයන්ගේ වෘත්තිය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරීමේ අදහසින්, රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධාන කිරීම සහ පැවැත්වීම;
3. යුක්තිය පසිඳලීම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණු වීමේ සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරීම සහ පැවැත්වීම;
4. අධිකරණ නිලධරයන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයිම.

## 5. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ඉතිහාසය

අධිකරණ කටයුතු හැදෑරීම සඳහා පහසුකම් සැලසීම ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධාරීන් පුහුණු කිරීම සහ වෘත්තිය වශයෙන් ඔවුන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති එකම ආයතනය වශයෙන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය, විශිෂ්ඨ මට්ටමේ කීර්තියක් අත්පත් කරගෙන ඇත.

විනිශ්චයකාරවරුන්ගේ ආයතනය පිහිටුවීමට පෙරාතුව, අධිකරණ නිලධාරින් වෙත තිබූ එකම පුහුණු ඉඩ ප්‍රස්ථාව වූයේ තම රාජකාරී ආරම්භ කිරිමට ප්‍රථම විනිශ්චයාසනය හොබවන ප්‍රධාන විනිසුරුතුමා සමඟ සති කිහිපයක් අධිකරණ කටයුතු නිරීක්ෂණය කිරීම පමණකි. යුක්තිය පසිඳලන විනිසුරුවරුන්ට නීති වෘත්තිය ආරම්භයේදී පමණක් නොව වෘත්තිය කාලය පුරාවටම අඛන්ඩ පුහුණුවක අවශ්‍යතාව දැඩි ලෙසම හැඟී ගිය බැවින් අධිකරණ නිලධාරීන් සඳහා විධිමත් සහ ක්‍රමානුකූල අධිකරණ පුහුණුවක් ලබා ගත හැකිවන පරිදි නිත්‍ය පුහුණු ආයතනයක් ස්ථාපිත කළ යුතු බව අවබෝධ කර ගන්නා ලදී.

එවැනි පුහුණු ආයතනයක් එවකට ප්‍රංශයේ පිහිටුවා තිබෙන බව දැක තිබූ, අධිකරණ අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම්වරයා වූ පී.බී. හේරත් මැතිතුමා විසින් එවැනි පුහුණු ආයතනයක් පිළිබඳ වූ අදහස් පළමුවම සාකච්ඡාවට බඳුන් කරන ලදී.

නමුත් සාමාන්‍යයෙන් සිදුවන ආකාරයට ඒ පිළිබඳව කිසිවකුගේ අවධානය යොමු නොවූ අතර එය මුලුමනින්ම අසාර්ථක විය. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කරමින්

විනිශ්චයකාරවරුන්ගේ ආයතනය ස්ථාපිත කිරීමේ කාර්යෙහි පුරෝගාමියා වූ පී.බී හේරත් මැතිතුමා දැඩි අධිෂ්ඨායෙන් යුක්තව තම අභිමාතර්ථය මුදුන් පමුණුවා ගැනීම පිණිස වඩා උන්නදුවකින් හා කැපවීමකින් යුතුව කටයුතු කළ අතර ඔහු ආයතනයට සුවිශේෂ මිත්‍ර පාක්ෂිකයකු විය.

එවකට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලේ උත්කෘෂ්ට චරිතයක් හෙබවූ ගරු විනිසුරු ආචාර්ය ඒ.ආර්.බී. අමරසිංහ මැතිතුමා 1983 සැප්තැම්බර් මස පමණ වන විට, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් වැඩ භාරගත් අතර එතුමාගේ උද්යෝගිමත් නායකත්වය යටතේ එතැන් පටන් අධිකරණ අමාත්‍යාංශය පාලනය විය. ඉන් අනතුරුව 1984 වර්ෂයේ අවසන් භාගය වන විට, එවකට ගරු අගවිනිසුරුවයා වූ රාජ නීතිඥ නෙවිල් ඩී.එම්. සමරකෝන් මැතිතුමා විසින්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු වශයෙන් විශ්‍රාම ගොස් සිටි ගරු විනිසුරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමාට සහ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වූ ආචාර්ය ඒ.ආර්.බී. අමරසිංහ මැතිතුමාට තමා සමඟ සාකච්ඡාවකට සහභාගි වන ලෙස ඇරයුම් කරන ලදී.

විනිශ්චයකාරවරුන්ට අඛන්ඩවම නීතිය හැදෑරීම සඳහා සේවාස්ථ පුහුණු පහසුකම් ඇති කරලීමේ අරමුණෙන් විනිශ්චයකාරවරුන්ගේ ආයතනය ස්ථාපිත කිරීමට ඔවුන් එක්ව කටයුතු කරන ලදී. 1984 මැයි මස 02 වන දින ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් විනිසුරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමා පත්කර ගන්නා ලදී. ආසියානු පදනමේ නේවාසික නියෝජිතයකු වූ ජෝන් ගයර් මහතා සමඟ ඒ වන විටත් අරමුදල් පිළිබඳව වූ ගැටලුව සාකච්ඡා කොට තිබුනි. ඉන් අනතුරුව ඇති වූ ප්‍රධානම ගැටලුව වූයේ නව ආයතනය පිහිටුවීම සඳහා සුදුසු පරිශ්‍රයක් සොයා ගැනීමයි. විකල්ප ගණනාවක් පිළිබඳව අවධානය යොමු කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා පදනම ආයතනයේ උපගෘහය වසරක කාලයක් සඳහා කුලියට ලබා ගන්නා ලදී.ඉන් පසුව අවශ්‍ය ලී බඩු සහ කාර්යාල උපකරණ සපයා ගැනීමට පියවර ගන්නා ලදී. මෙම සියලුම කාර්යයන් ආසියානු පදනමේ මුල්‍යාධාර මත සිදු කෙරිණි. ඉන් අනතුරුව සම්මන්ත්‍රණ කිහිපයක් පැවැත්වූ අතර රජයේ අනුමැතිය ලබා ගැනීමට සිදු වූ නිසා විශේෂිත වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කිරීමට හැකි වුනි. අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කලද ඒ සඳහා රජයේ අනුමැතිය ලබැ ගැනීමට හැකිවේද යන්න පිළිබඳව සැකයක් මතුවුනි.

1985 වර්ෂය ආරම්භයේදී පමණ විනිශ්චයකාර වරුන්ගේ ආයතනය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර නවතා දමන ලෙස නියෝගයක් ලැබුණි. ඉන් අනතුරුව එම කාර්යභාරය සම්බන්ධයෙන් ව්‍යවස්ථාවක් පැනවීමට කටයුතු කරන ලදී. මේ අතරතුර අමාත්‍ය මණ්ඩල නියෝගය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සම්මන්ත්‍රණ කිහිපයක් සංවිධානය කිරීමට භාරගන්නා ලදී. එවැනි සම්මන්ත්‍රණයක් 1985 වර්ෂයේ නොවැම්බර් මස සංවිධානය කළ අතර විනිසුරු ජේ.එෆ්.ඒ සෝසා මැතිතුමා එහි මුලසුන හෙබවූ අතර එතුමා විසින් එහිදී ඇප සම්බන්ධයෙන් දේශණයක් පවත්වන ලදී. එවකට ශ්‍රී ලංකාවේ සිටි ප්‍රමුඛ පෙළේ නිතිඥයින්ටද ඒ සඳහා ආරාධනා කරන ලදී. ඔවුන් අතර , ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා, රාජ නිතිඥ ඒ.එච්.සී ද සිල්වා මහතා සහ නිතිපති දෙපාර්තමේන්තුවේ හිටපු නිතිපති සුනිල් ද සිල්වා මහතා, පසුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු වශයෙන් පත්වූ ගරු පී. රාමනාදන් මැතිතුමා සහ ගරු ප්‍රියන්ත පෙරේරා මැතිතුමා ආදී විද්වතුන්ද ඒ සඳහා සහභාගි විය.

එහිදී විශිෂ්ට මට්ටමේ දේශණ කිහිපයක් පැවැත්වූ අතර ඉතාමත් අනර්ඝ තත්ත්වයේ සාකච්ඡා වට කිහිපයක්ද ඉන් අනතුරුව පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණයේ ආරාධිත දේශකයා වූයේ විනිසුරු ක්ලිෆර්ඩ් වොලස් මැතිතුමාය. ඔහු නීති ක්‍රම සහ නිති පරිපාලනය සම්බන්ධයෙන් ආසියානු පදනමේ ජ්‍යෙෂ්ඨ උපදේශකයකු වූ අතර ඇමරිකා එක්සත් ජනපදයේ 9 වන පළාතේ අභියාචනාධිකරණයේ ගරු කටයුතු විනිසුරුවරයෙකි.

මුලිකවම ආරම්භ කළ විනිශ්චයකාරවරුන්ගේ ආයතනය එසැනින්ම අක්‍රිය තත්ත්වයට පත්වූ අතර වාසනාවකට මෙන් පරිශේෂ ප්‍රාඥයකු සහ දාර්ශනිකයකු වූ ආචාර්ය ඒ.ආර්.බී. අමරසිංහ මැතිතුමා, එම අභිප්‍රාය මුදුන්පත් කර ගැනීම සඳහා මහඟු දායකත්වයක් ලබාදුන් අතර එතුමාගේ අප්‍රතිහත ධෛර්යය හේතුවෙන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ස්ථාපිත කිරීමට මාවත විවර වුනි.

අනතුරුව 1985 නොවැම්බර් 20වන දින සහතික කරන ලද 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය පනත නම් වූ පාර්ලිමේන්තු පනතක් මගින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය ස්ථාපිත කරන ලදී. 1986 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි අධ්‍යක්ෂකවරයා වශයෙන් විනිසුරු සෝසා මැතිතුමා විධිමත් ලෙස පත් කරන ලදී. එතැන් පටන් සම්මන්ත්‍රණ, වැඩමුලු, ප්‍රායෝගික සටහන් සමඟ උපදේශාත්මක සේවාවන් ආදිය පවත්වමින් විනිශ්චයකාරවරුන්ගේ ආයතනය හැකි සෑම අයුරින්ම විනිසුරු වෙත සේවා සපයන ලදී. 1990 වර්ෂයේදී විනිසුරු සෝසා මැතිතුමාට සහාය දැක්වීම පිණිස නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන් විනිසුරු කේ. වික්නරාජා මහතා සහ අගවිනිසුරු කාර්යාලයෙන් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව පී.නෙවිල් ඒ. දසිල්වා මහතා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ලේකම් වශයෙන් ඊට සම්බන්ධ විය.

විනිශ්චයකාරවරුන්ගේ ආයතනය කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය වන අතර ගරු අගවිනිසුරුතුමා නිල බලයෙන් එහි සභාපතිවරයා වන අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිසුරුවරු දෙදෙනෙකු අනෙකුත් සාමාජිකයන් දෙදෙනා වශයෙන් පත් කෙරේ. විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පරිපාලන සහ කළාමනාකරණ කටයුතු කළමනාකරණ මණ්ඩලයට පවරා ඇත.

ආයතනයේ අරමුණු පහත සඳහන් වේ. –

1. අධිකරණ නිලධරයන් විසින් අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් මත සහ අදහස් හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම;
2. අධිකරණ නිලධරයන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරීමේ අදහසින් , රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධාන කිරීම සහ පැවැත්වීම;
3. යුක්තිය පසිඳලීම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණුවීමේ සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරීම සහ පැවැත්වීම;
4. අධිකරණ නිලධාරීන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයීම.

විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රථම සභාපතිවරයා වූයේ ආයතනයට ඉමහත් සේවයක් සැලසු ගරු අගවිනිසුරු එස්. ෂර්වානන්ද මැතිතුමායි. ඉන් අනතුරුව ගරු අගවිනිසුරු පාරින්ද රණසිංහ මැතිතුමා එම තනතුර හොබවන ලදී. ඔහු අධිකරණ සාමාජිකයකුව සිටියදීම ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් කැප වී ක්‍රියා කළ අතර එහි සෑම සම්මන්ත්‍රණයකටම සහ සෑම කටයුත්තකටම උද්යෝගී ලෙස සහභාගී විය. විනිශ්චයාසනය සහ නීතිඥ සංගමය අතර සුහදශීලි වාතාවරණයක් ගොඩනැංවීම සඳහා ඔහු නීතිඥයින් සහ සමික්ෂකයන් සමඟ සාකච්ඡා කොට අධීක්ෂණ කමිටු පිහිටුවන ලදී. ඔහු පිළිබඳ මතකය සදාතනිකව අප හදවත් වල රැඳෙනු ඇත.

ඉන් අනතුරුව, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සිටියදී ආයතනයේ ප්‍රගතිය වෙනුවෙන් ඉමහත් දායකත්වයක් ලබා දෙන ලද විනිසුරු එච්.ඩී. තම්බයියා මැතිතුමා ගරු අගිවිනිසුරු තනතුරට පත්වීමෙන් අනතුරුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති වශයෙන් මහඟු සේවාවක් ඉටු කරන ලදි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ එවකට සිටි ලේකම්වරයකු වූ ඒ.එස්. විජේතුංග මහතා ද ආයතනය නඟා සිටුවීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් කළ පුරෝගාමී නායකයෙකි. ඔහු ඉන් අනතුරුව අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු වශයෙන් කටයුතු කළ අතර ඔහු ආයතනය වෙත අනගිභවනිය සේවාවක් ඉටු කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයකු බව ප්‍රකට කරුණකි. ඔහුගේ අනුප්‍රාප්තිකයා වූ ලාල් පීරිස් මැතිතුමා සහ ඔහුගේ සහායක වූ එස්. විතානාච්චි මහතා ද ආයතනය කෙරෙහි මහත් කැපවීමකින් හා වීර්යකින් යුක්තව කටයුතු කරන ලදී. ආයතනයේ සුභසාධනය වෙනුවෙන් ඔවුන් මහත් උනන්දුවකින් යුක්තව සේවය කළ අතර ඔවුන් ආයතනයට මහඟු ශක්තියක් විය.

ආයතනය තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා උරදුන් ආසියානු පදනමේ හිටපු ප්‍රධානි ජෝන් ගයර් මැතිතුමාටද ඉන් අනතුරුව පත් වූ නික් ලැන්ග්ටන් මැතිතුමාටද විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙනුවෙන් අපගේ කෘතඥතාව පිරිනමන්නෙමු. ආසියානු පදනම විසින් අප ආයතනය කෙරෙහි නිසි සැලකිල්ල යොමු කිරීමත් අප ඔවුන්ගේ අරප්ලාභියකු ලෙස සළකා මූල්‍යමය ආධාර ප්‍රදානය කිරීමත් පිළිබඳව අප ආඩම්බර විය යුතුය.

ඉන් අනතුරුව ආයතනය, අළුත්කඩේ ශ්‍රේෂ්ඨාධිකරණ පරිශ්‍රෙය් පිහිටු වූ අතර රජය විසින් එහි නඩත්තු වියදම් දරන ලදි. ආයතනයේ නිතිමය ගැටලු සම්බන්ධයෙන් අභියාචනාධිකරණ වල ජ්‍යෝෂ්ඨ විනිසුරුවරුන්ගේ විශේෂඥ ඥානය සහ අත්දැකීම් ලබාගන්නා අතර නඩු විභාග විනිසුරුවරු සඳහා වූ පුහුණු වැඩසටහන් සම්පාදනය කිරිමේදි ඇතිවන පරිපාලන ගැටලු සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ නිලධාරින්ගේ සහාය ලබා ගනි.

1990 නොවැම්බර් මස අධිකරණ කටයුතු හැදෑරීම සහ පර්යේෂණ සම්බන්ධයෙන් වූ කැලිෆෝනියා මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පෝල් එම්.ලී මහතා ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔහු විසින් ව්‍යාපෘතියක් වශයෙන් පහතින් සඳහන් කර ඇති පියවරයන්ගේ සමන්විත වන අධිකරණ කටයුතු සම්බන්ධයෙන් වූ විස්තීරණ අධ්‍යාපනික පුහුණු වැඩසටහනක් (පුරෝගාමී පදනමින්) සම්පාදනය කොට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙත ප්‍රදානය කරන ලදි:

(1) නවක සාමාජිකයන්ගේ නෛතික දැනුම් හා හැකියාවන් වැඩිදියුණු කිරීම හා යාවත්කාලින කිරිම සඳහා පසුව අඛන්ඩ අධ්‍යාපනයක් ලබාදීම සමඟ ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ නවක සාමාජිකයින් සඳහා මාස 6 ක වෘත්තීය අධ්‍යාපන වැඩසටහනක් හඳුන්වාදීම;

(2) දිස්ත්‍රික් අධිකරණ සහ මහාධිකරණ සඳහා උසස්වීම් ලද නව විනිශ්චයකාරවරු සඳහා එක් මසක සේවාස්ථ සේවාරම්භක වැඩසටහනක් වෙනම පැවැත්වීම.;

(3) නව නීතිමය සංවර්ධනයන් වශයෙන් නවතම තොරතුරු දැනගැනීම සඳහා සහාය සැලසිම සහ පොදු සහ තනි පුද්ගල අධිකරණ ගැටලු හඳුනා ගැනීම මෙන්ම ප්‍රාදේශීය අධිකරණ චර්යාවන් සහ ක්‍රියාපටිපාටි ප්‍රමිතිගත කිරීම සඳහා පිළිවෙලින් මහෙස්ත්‍රාත්වරු, දිස්ත්‍රික් අධිකරණ විනිසුරුවරු, මහාධිකරණ විනිසරුවරු සහ අභියාචනාධිකරණ විනිසුරුවරු සඳහා අඛන්ඩ සේවාස්ථ අධ්‍යාපන සම්මන්ත්‍රණ වාර්ෂිකව පැවැත්වීම.

(4) අධිකරණ කළමනාකරණය, සන්නිවේදන නිපුණතා, කාන්තාව සහ ළමුන් සඳහා අධිකරණ ශාලාව තුල පහසුකම් ඇතිකිරීම, නෛතික කරුණු සොයා බැලීම සහ තීරණ ගැනීම සහ නිති විද්‍යාය සහ මානව දයාව සහ පවුල් නීතිය, ළමා නීතිය අපරාධ නීතිය, සිවිල් නීතිය, ප්‍රොබෙට් බලපත්‍ර සහ මානසික සෞඛ්‍යය පිළිබඳ නිතිය, ඉඩම් සහ බෙදුම් නඩු නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය පිළිබඳ ගැටලු ඇතුලත්ව විශේෂිත නෛතික කාර්ය පැවරුම් මෙහෙයවිම වැනි වැදගත් නීති විෂයයන් සම්බන්ධයෙන් කාලපර්ච්ඡෙදානුකූලව සතියක කාලයක් පැවැත්වෙන උසස් නෛතික අධ්‍යයනය වැඩසටහන්;

(5) ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය පටිගත කිරීම, අධ්‍යාපනික මෙවලම් (අධිකරණවල විනිසුරුවරු සඳහා මූලික පුස්තකාල පහසුකම් සහිතව) ඇතුලු අධිකරණ සඳහා අවශ්‍ය කෙරෙන නිතිපතා භාවිතා කෙරෙන සවිස්තරාත්මක අධ්‍යන උපකරණ හඳුන්වාදීම. (නඩු පොත්, පාරිභාෂිත වචන සහ ලිඛිත යෙදුම් සමඟ විමර්ශන ලැයිස්තුව, අත්පොත් සහ අනෙකුත් පරිශීලන ග්‍රන්ථ);

(6) උපදේශන විනිසුරුවරු සඳහා ඵලදායි නීති පිඨ සංවර්ධන වැඩසටහන්;

(7) අධිකරණ කටයුතු වර්ධනය කිරීම සහ නීති ප්‍රමාදය පිටුදැකීම සඳහා මෙන්ම විනිසුරුවරුන්ගේ සදාචාරාත්මක චර්යාවන් සහ පොදුජන වගකීම් ඉහළ නැංවීම සඳහා දැනට කෙරීගෙන යන පර්යේෂණ ඉඩම් සංවර්ධන වැඩසටහන් හඳුන්වාදීම;

(8) ඉහතින් සඳහන් කර ඇති අධිකරණ කටයුතු හැදෑරිමේ ක්‍රියාකාරකම් සවිබල ගැන්වීම සඳහා ඉඩ පහසුකම් ඇති පන්ති කාමර, කාර්යාල පහසුකම්, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ අනෙකුත්

සම්පත් සහිතව කුලී පනදම මත පුහුණු පහසුකම් ලබා ගැනීම සහ සැලසුම් කිරිම හෝ එපරිදි අනාගත ඉදිකිරිමේ සැලසුම් කිරීම.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ නීතිය, ගුණාත්මක වශයෙන් ප්‍රවර්ධනය කිරිම සහ සාධාරණ මෙන්ම වේගවත් සහ ඵලදායි ලෙස යුක්තිය පසිඳලීම සඳහා නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමයි. ඒ සඳහා අධිකරණ සාමාජිකයන් ගේ විෂය පථය සහ වගකීම් සම්බන්ධයෙන් ඔවුන් ක්‍රමානුකූල ලෙස සකස් කළ යුතුය. එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන් රාජකාරි භාරගත් අවස්ථාවේදී පමණක් ලබා දෙන විධිමත් පුහුණුව ප්‍රමාණවත් නොවන අතර වෘත්තිය කාලය පුරාවටම අඛන්ඩව අධ්‍යාපන ලබාදීම සිදු කළ යුතුය. නිතියේ ගුණාත්මක භාවය රඳා පවතින්නේ විනිසුරුවරු කොතරම් හොඳ මට්ටමක සිටීද යන්න මතයි. ඒ සඳහා නීති පමණක් ප්‍රමාණවක් නොවේ. පසිඳලනු ලබන යුක්තියද යුක්තිය පසිඳලනු ලබන විනිසුරුවරු මෙන්ම ගුණාත්මක තත්වයක පැවතිය යුතුය. ලෝකයේ සියලුම රටවල් නීතියේ ආධිපත්‍යය වෙත බැඳී සිටින අතර එය හොඳින් අවබෝධ කරගෙන සිටින අතර එය හෝඳින් අවබෝධ කරගෙන සිටී. එමනිසා විනිසුරුවරු සඳහා පුහුණු පහසුකම් සහ අධ්‍යාපන වැඩසටහන් සපයනු ලැබේ.

මෙම කාල පරිච්ඡේදය තුළදී ශ්‍රේෂ්ඨාධිකරණයේ කාමර අංක 10308 හි මෙම ආයතනය පිහිටුවා තිබුනි. ශ්‍රී ලංකා විනිශ්චයාකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරුවරයකු වු ගරු කේ. වික්නරාජා මැතිතුමා, ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වශයෙන් පත්කරන ලද අතර ඔහු විනිසුරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමා සමඟ එක්ව අධිකරණ නිලධාරීන් සඳහා සේවාස්ථ පුහුණු වැඩ සටහන් පවත්වන ලදි. විනිසුරු කේ. වික්නරාජා මැතිතුමා ආයතනයෙන් ඉවත්ව ගිය පසු 1986 වර්ෂයේදී, විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසරුවරයකු වු ගරු එස්. ජේ.ඩී.ද එස් විජයරත්න මැතිතුමා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත්විය. ඉන් අනතුරුව විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරුවරයකු වු ගරු පී.එච්.කේ. කුලතිලක මැතිතුමා 2002 වර්ෂයේදී නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත්විය. නිතිපති දෙපාර්තමේන්තුවෙ සාමාජිකයකුවූද, මහාධිකරණ විනිසුරුවරයකු සහ අභියාචනාධිකරණ විනිසුරුවරයකු වූ එතුමාගේ හසල දැනුම සහ පෘථුල අත්දැකීම් සම්භාරය හේතුවෙන් ඔහු විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මහඟු සම්පතක් වූ අතර අධිකරණ නිලධාරීන්ට සුවිශේෂි උපදේශකයකුද විය.

ගරු අගවිනිසුරු ජී.පී.එස්. ද සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් අනතුරුව 2000 වර්ෂයේදී විනිසුරු සරත් එන් සිල්වා මැතිතුමා ගරු අගවිනිසුරු වශයෙන් පත්කරන ලදී.

ගරු අගවිනිසුරු සරත් එන් සිල්වා මැතිතුමා විනිශ්චයතාරවරයන්ගේ ආයතනයට මහා පහන් ටැඹක් බඳු විය. විජේරාම මාවතේ පිහිටි ඔහුගේ නිල නිවස, විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වශයෙන් භාවිතා කිරිම සඳහා ඔහු අවසර ලබාදුන් අතර අධිකරණ නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා නීති සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ අරමුදල් උපයෝගී කර ගැනීමටද අවසර ලබා දෙන ලදී.

ලෝක බැංකුවේ අනුග්‍රාහකත්වය ඇතිව අධිකරණ නීති ප්‍රතිසංසකරණ සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සහාය සහිතව අධිකරණ නිලධාරීන් සඳහා විදේශ ශිෂ්‍යත්ව පිරිනැමීම මගින් දිගු කාලීන අධිකරණ පුහුණු පහසුකම් ඇති කිරිමට ගරු අගවිනිසුරු සරත් එන් සිල්වා මැතිතුමා පුරෝගාමීව කටයුතු කරන ලදී. මෙම ව්‍යාපෘතියේ එක් අරමුණක් වූයේ කාර්යක්ෂම ලෙස සහ නිසි පරිදි ආරවුල් විනිශ්චය කිරිමට හැකි නව නීති ක්‍රමයක් ස්ථාපිත කිරිමයි. වානිජ නීතිය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් සහිතව නවක අධිකරණ නිලධාරීන් මෙන්ම සේවාස්ථ විනිසුරුවරු සඳහාද විස්තීරණ පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරිම සහ අධිකරණ ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම මෙම ව්‍යාපෘතියේ ඒකාබද්ධ අංගයක් විය. එක් වර්ෂයකට අධිකරණ ක්ෂෙත්‍රය නිලධාරීන් තුන් දෙනෙකු (03) එල්.එල්.එම්. වැඩසටහන (නීතිපති උපාධිය) වෙත සම්බන්ධ කරලීම වෙනුවෙන් අධ්‍යනය ගාස්තු, ගමන් වියදම්,

නවාතැන් පහසුකම් සහ සාධාරණ යැපුම් දීමනාවක් ඇතුලුව මුලු පිරිවැය එකී අරමුදල විසින් ආවරණය කරන ලදී.

එවකට විජේරාම මාවතේ පිහිටි ඔහුගේ නිල නිවසේ ස්ථාපිත කර තිබූ විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේදී අධිකරණ නිලධාරීන් සහ අධිකරණ කාර්ය මණ්ඩල වෙත පරිගණක පුහුණුව ලබාදීම සඳහා ද එතුමා පියවර ගන්නා ලදී. ඔහුගේ ධූර කාල සීමව තුලදී අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කරන ලද අතර එහි 5 වන මහළ විනිශ්චය කාරවරුන්ගේ ආයතනය සඳහා ද හතරවන මහලෙන් කොටසක් විනිසුරු නිල නිවාස සඳහා ද වෙන් කරන ලදී. ආයතනය වෙත සහාය දැක්වීම සම්බන්ධයෙන් සහ 2000 වසරේ සිට 2009 වසර දක්වා වූ ඔහුගේ ධූර කාල සීමාව තුලදී ආයතනයේ කටයුතු වෙනුවෙන් සිදුකරන ලද අවංක කැපකිරීම් වෙනුවෙන් විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කෘතඥතාව ගරු අගවිනිසුරු සරත් එන් සිල්වා මැතිතුමාට පුද කර සිටින අතර සෑම අවස්ථාවකදීම ආයතනයේ නිසි ගෞරවය එතුමාට පුද කෙරෙනු ඇත.

වසර 21 කට අධික කාලයක් තිස්සේ ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කරමින් මහඟු සේවාවක් සිදු කරන ලද සහ එකී ආයතනයේ සමාරම්භක අධ්‍යක්ෂවරයා වූ විනිසුරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමා එම ආයතනයට මෙන්ම අධිකරණ නිලධාරීන්ටද විශිෂ්ට සේවාවක් ඉටු කරමින් 2008 වර්ෂයේදී විශ්‍රාම ගන්නා ලදී.

විනිසුරු ජේ.රෆ්.ඒ. සෝසා මැතිතුමා අඛන්ඩවම අප වෙත සහයෝගය ලබාදෙමින් අපගේ අනුප්‍රාණය බවට පත්වුවා සේම එතුමා සදාකල්හිම අපගේ මතකයේ රැදෙනු ඇත.

විනිසුරු සෝසා මැතිතුමා විශ්‍රාම යාමෙන් අනතුරුව විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිශ්ශංක උදලාගම මැතිතුමා 2008 වර්ෂයේදී අධ්‍යක්ෂවරයා වශයෙන් පත්වූ අතර 2011 වසර දක්වා විනිසුරු උදලාගම මැතිතුමා අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන ලදී. එතුමාගේ ධූර කාල පරිච්ඡේදය තුලදී විනිසුරු උදලාගම මැතිතුමා විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ පළමු වෙබ් අඩවිය ආරම්භ කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු, අභියාචනාධිකරණ සහ මහාධිකරණ විනිසුරුවරුන්ගේ සහාය ඇතිව අධිකරණ නිලධාරීන් සඳහා අපරාධ, සිවිල්, වාණිජ නීති ආශ්‍රිත ගැටලු සිද්ධි කළමනාකරණය සහ ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම සම්බන්ධයෙන් පාඨමාල ග්‍රන්ථ 10 කට වැඩි ප්‍රමාණයක් ප්‍රකාශයට පත්කොට ඇත. විනිසුරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමා, විනිසුරු උදලාගම මැතිතුමා සහ විනිසුරු බී.එච්.කේ. කුලතිලක මැතිතුමා ඒ සඳහා දායක වී ඇත. විනිසුරු නිශ්ශංක උදලාගම මැතිඳුනි, ආයතනය වෙනුවෙන් ඔබ සිදු කළ මෙහෙය සඳහා අපගේ උපහාරය පුදකර සිටින්නෙමු. අගවිනිසුරු ගරු සරත් එන් සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් අනතුරුව විනිසුරු අශෝක සිල්වා මහතා 2009 වර්ෂයේදී අග විනිසුරු වශයෙන් පත් කරන ලදී. එතුමාගේ ධූර කාලය තුලදී, විනිසුරු පී.එච්.කේ. කුලතිලක මහතා අතිරේක අධ්‍යක්ෂ වශයෙන් 2009 වර්ෂයේදී පත්කරන ලද අතර විශ්‍රාමික ශේෂ්ඨාධිකරණ විනිසුර ටී.බී. වීරසූරිය මැතිතුමා සමග 2011 වර්ෂයේදී එතුමා සම අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී. විනිසුරු ටී.බී. වීරසූරිය මැතිතුමා සහ විනිසුරු කුලතිලක මැතිතුමා විසින් ආයතනයට විශිෂ්ඨ සේවයක් සිදු කළ අතර ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු වශයෙන් ඔවුන් සතු අති විශාල දැනුම් සම්භාරය සහ අත්දැකීම් ආදිය පදනම් කරගනිමින් සිවිල් සහ අපරාධ අධිකරණ වල විනිසුරුවරු පුහුණු කරන ලදී. ඔවුන් විසින් ආයතනය සහ අධිකරණ පද්ධතිය වෙත ලබාදුන් විශිෂ්ඨ සේවය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. අපගේ ප්‍රවීනයන් වශයෙන් සෑම අවස්ථාවකදීම අප ඔවුන් වෙත ගෞරවය පුදකර සිටින්නෙමු.

ආයතනයේ සහාය ඇතිව ගරු අගවිනිසුරු අශෝක සිල්වා මැතිතුමා විසින් අධිකරණ කටයුතු හැදෑරීම සහ පුහුණු කිරීම සම්බන්ධයෙන් මෙන්ම පුහුණු වැඩසටහන් සහ පුහුණුවේ අන්තර්ගතය ප්‍රති ව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරන ලදී. මහාධිකරණ විනිසුරුවරු සහ අධිකරණ නිලධාරීන් සඳහා වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. එවැනි සම්මන්ත්‍රණ කිහිපයක් සඳහා අගවිනිසුරු අශෝක සිල්වා මැතිතුමා සහභාගි වූ අතර ආයතනයේ සියලුම කටයුතු සඳහා එතුමා සහාය දක්වන ලදී. මෙම කාල පරිච්ඡේදය තුලදී පුහුණු මොඩියුල කිහිපයක් ප්‍රසිද්ධ කළ අතර අධිකරණ පුහුණුව සඳහා සම්පත්දායි

පුද්ගලයන් වශයෙන් සේවාස්ථ විනිශ්චයකාරවරු සහ විශ්‍රාමික විනිශ්චයකාරවරුන්ගේ සේවය ලබා ගන්නා ලදී. නවක විනිසුරුවරු පුහුණු කිරිම සඳහා මහාධිකරණ විනිසුරුවරුන් හට ආරාධනා කරන ලෙස එතුමා ආයතනය වෙත උපදෙස් දෙන ලදී.

මෙම කාල පරිච්ඡේදය තුලදී විනිශ්චයකාරවරයන්ගේ ආයතනය අධිකරණ අමාත්‍යාංශයට අයත් නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබු අතර විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙත නව ශ්‍රවාණාගාරයක්, පරිගණක කාමරයක් , පුස්තකාලයක් සහ විනිසුරු නිවාස ලබා දීම සඳහා පියවර ගැනීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ හිටපු ලේකම් සුහද ගමලත් මහතා වෙත ආයතනය වෙනුවෙන් කෘතඥතාව පළකර සිටින අතර විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙත අමතර පහසුතකම් ලබාදීම සඳහා ප්‍රයත්න දැරිම සම්බන්ධයෙන් එතුමාට අපගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටින්නෙමු.

අගවිනිසුරු ගරු අශෝක සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් අනුතරුව 2011 වර්ෂයේදී විනිසුරු ශිරාණි බණ්ඩාරනායක මැතිනිය අගවිනිසුරුතුමිය වශයෙන් පත්වූ අතර අනතුරුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිනිය වශයෙන්ද කටයුතු කරන ලදී . විනිසුරු ටී. වීරසූරිය මැතිතුමා සහ විනිසුරු පී.එච්.කේ කුලතිලක මැතිතුමා, 2012 මැයි මස දක්වා ආයතනයේ සම අධ්‍යක්ෂවරු වශයෙන් කටයුතු කරන ලදි. ඉන් අනතුරුව 2012 ජුනි මස විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් විනිශ්චයාසනය හොබවන මහාධිකරණ විනිසරුවරයකු වු රුවන් ප්‍රනාන්දු මහතා පත්කරන ලද අතර ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකරණ වශයෙන් විනිශ්චයාසනය හොබවන මහේස්ත්‍රාත්වරයකු වු මහි විජේවීර මහතා පත්කරන ලදී.

කළමණාකරණ මණ්ඩලයේ ප්‍රධානී වු අගවිනිසුරු ශිරාණී ඒ බණ්ඩාරණායක මැතිනිය, ආයතනයේ කටයුතු වලට සුවිශේෂී සහයෝගයක් ලබා දුන් අතර ආයතනයේ ප්‍රගතිය වෙනුවෙන්ද විශිෂ්ට දායකත්වයක් ලබා දෙන ලදී. මෙම කාල පරිච්ඡේදය තුලදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ගණකාධිකාරිවරයා වැඩ බැලීමේ පදනම විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වැඩ බලන ගණකාධිකාරිවරයා වශයෙන් පත් කරන ලදී. තවද, විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අධිකරණ රෙජිස්ට්‍රාර්වරයකු සහ කළමනාකරණ සහකාරවරු තිදෙනෙක් ද ආයතනය වෙත පත්කර ගන්නා ලදී. අධිකරණ අමාත්‍යාංශය වෙතින් කණිෂ්ට සේවකයන් දෙදෙනෙකු විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙත අනුයුක්ත කිරිම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම්වරයා වු සුහද ගමලත් මහතා වෙත ආයතනය වෙනුවෙන් කෘතඥතාව පළකර සිටිමු.

2012 වර්ෂයේදී ආයතනයේ ඒකාබද්ධ සැලැස්ම සහ ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන ලද අතර ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ මුදල් රෙගුලාසි යටතේ ආදායම් හා වියදම් සම්බන්ධයෙන් බලය පැවරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි. ආයතනය විසින් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන අතර ආයතනයේ සේවක සංඛ්‍යාවද සකස් කොට ඇත. තවද කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්ට පුහුණු වැඩසටහන් ද පවත්වන ලදී. මෙම කාල පරිච්ඡේදය තුලදී විනිශ්චයකාරවරයන්ගේ ආයතනය නවින තාක්ෂණික උපකරණ වලින් සමන්විත පුහුණු පාඨමාලා සහ පර්යේෂණ පහසුකම් වලින් සපිරි ආයතනයක් බවට පත්කිරීමේ අරමුනෙන් පුහුණු වැඩසටහන් ප්‍රතිව්‍යුහ ගත කිරීමෙන් දැනට තිබෙන පහසුකම් නවීකරණය කිරීමත් ආරම්භ කරන ලදී.

ආයතනයේ ලේකම් කාර්යාලය ස්ථාපිත කිරිම සඳහා සුදුසු ස්ථානයක් සොයා ගැනීම සඳහාත් පුහුණු වැඩසටහන් දීර්ඝ කිරීම සඳහාත් wi – Fi පහසුකම් වලින් සහ අනෙකුත් පූර්ණ පහසුකම් වලින් සමන්විත පරිගණක විද්‍යාගාරයකින් සමන්විත පුස්තකාලයක් සකස් කිරිම මගින් පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහාත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනයේ (ICTA) සහාය ඇතිව වෙබ් අඩවිය ප්‍රති සක්‍රිය කිරීම සඳහාත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තා නොකළ නඩු තීන්දු එක් රැස් කිරීම සඳහාත් ආයතනය ඇතුලතම විනිසුරුවරුන්ට නේවාසික පහසුකම් සලසාදිම සඳහාත්, එක්සත් ජාතින්ගේ

සංවර්ධන වැඩසටහනේ ඉල්ලීම මත අධිකරණ නිලධාරීන් සඳහා පුහුණු අත්පොතක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම සඳහාත් අවශ්‍ය කෙරෙන කාර්ය මණ්ඩල බඳවා ගැනීම සඳහාත් පරිගණක විභේදන (Computer Server) පරිගණක මුද්‍රිත පිටපත්, (Computer Print Outs) ඡායා පිටපත් පහසුකම් වැනි අවශ්‍ය කෙරෙන භෞතික සම්පත් සැපයීම සඳහාත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ බල අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි පරිපාලන ගැටලු විසඳීම සඳහාත් යන කාරණා සඳහා ආයතනය ප්‍රමුඛතාව ලබා දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් වෙත ආයතනය ස්වකීය කෘතඥතාව පළකර සිටින අතර ආයතනයේ කාර්ය මණ්ඩලයටද විශේෂයෙන්ම අධ්‍යයන සම්බන්ධීකාරක මහී විජේවීර මහතා සහ ආයතනයේ රෙජිස්ට්‍රාර්වරයා වන ඥානපාල මහතාට ද ආයතනයේ අවංක ස්තූතිය පිරිනමමි.

2013 ජනවාරි මස ගරු මොහාන් පීරිස් මැතිතුමා ශ්‍රී ලංකාවේ අගවිනිසුරු වශයෙන් පත්වූ අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති ධුරයද එතුමාට හිමිවිය. අගවිනිසුරු මොහාන් පීරිස් මැතිතුමා ආයතනය ආරම්භයේදී සිටම මෙම ආයතනයේ කටයුතු වලට අවංක සහාය ලබා දුන් අතර ඔහු එම ආයතනයට මහගු ශක්තියක් විය. 2013 අප්‍රේල් මස පමණ වන විට අධිකරණ අමාත්‍යාංශයට අයත් නව ගොඩනැගිල්ලේ අංශයක එහි කාර්යාලය පිහිටුවන ලද අතර ඒ සම්බන්ධයෙන් මූලික පියවර ගැනීම පිළිබඳව ගරු අගවිනිසුරු මොහාන් පීරිස් මැතිතුමාට අපගේ හෘදයාංගම ස්තූතිය පිරිනමන්නෙමු. ආයතනයේ කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ කොටසක් ලබාදීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් කමලිනී ද සිල්වා මහත්මියට ආයතනයේ කෘතඥතාව පිරිනමන්නෙමු. මහාධිකරණ විනිසුරුවරු කාති අධිකරණ වල විනිසුරුවරු අධිකරණ රෙජිස්ට්‍රාර්වරු වෙතද පුහුණු පහසුකම් සලසාදීම සඳහා ආයතනයේ පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කරලීම සම්බන්ධයෙන් ගරු අගවිනිසුරු මොහාන් පීරිස් මැතිතුමා පියවර ගන්නා ලදී. එතුමා විසින් ආයතනයේ සේවක සංඛ්‍යාව 9 -23 දක්වා ඉහල නංවන ලද අතර විද්වතුන්, වෘත්තීය සුදුසුකම්ලත් නීති විශාරදයින් සහ විවිධ ක්ෂේත්‍ර සම්බන්ධ ප්‍රවීනයන්ට ස්වකීය දැනුම සහ අත්දැකීම් විනිශ්චයකාරවරු සමඟ බෙදාහදා ගැනීම සඳහා ද ආරාධනා කරන ලදි. විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේදි විනිසුරුවන් වෙත දේශන පැවැත්වීම සඳහා ගරු අගවිනිසුරුතුමා විසින් විදේශ විනිසුරුවරුන්ට සහ නිති විශාරදයින්ට නිතිපතා ඇරයුම් කළ අතර එමගින් නෛතික මෙන්ම අධිකරණ පිළිබඳ ගැටලු ඔවුන් සමඟ අන්තර් හුවමාරු කරගැනීම සඳහා විනිසුරුවරුන්ට අවස්ථා උදා වේ. ගරු අගවිනිසුරු මොහාන් පීරිස් මැතිතුමා විසින් විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සහ අනෙකුත් ස්ථානවල පැවති සම්මන්ත්‍රණ, දේශන, සාකච්ඡා බොහෙමයක් සඳහා සහභාගි වූ අතර ඔහුගේ දැනුම සහ අත්දැකීම් විනිසුරුවරුන් අතර හවුලේ බෙදා හදා ගන්නා ලදී.

මෙම කාල පරිච්ඡේදය තුලදී, සාක්ෂි නීතිය සහ සිවිල් නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් නඩු පොත යාවත්කාලීන කිරිම සඳහා කමිටු 2 ක් පත් කරන ලදී . වර්තමානයේදී ගරු අගවිනිසුරු මොහාන් පීරිස් මැතිතුමා ප්‍රවීන විදේශ විනිසුරුවරුන්ගේ සහයෝගය ඇතිව සිද්ධි කළමනාකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ සිවිල් නීති ක්‍රමය සඳහා නීති ප්‍රතිසංස්කරණ සකස් කිරීමේ ප්‍රයත්නයන් සඳහා ආයතනයේ උපරිම සහයෝගය ලබා දෙයි.

ගරු අගවිනිසුරු මොහාන් පීරිස් මැතිතුමා එම තනතුර භාරගැනීමෙන් අනතුරුව ප්‍රධාන වශයෙන් සිද්ධි කළමනාකරණය, අධිකරණ පරිපාලනය සහ අධිකරණ ආචාරධර්ම සම්බන්ධයෙන් මැලේසියාව, ඉන්දියාව, සිංගප්පූරුව සහ ඉන්දියාව යන රටවලදී විනිසුරුවරු 200 කට අධික සංඛ්‍යාවක් සඳහා විදේශ පුහුණුව ලබා දෙන ලදී. මෙම කාල පරිච්ඡේදය තුලදී ආයතනයේ අධ්‍යයන සම්බන්ධිකාරකවරයා වශයෙන් ලක්මාල් වික්‍රමසූරිය මහතාගේ සේවය ලබාගත් අතර එතුමා විසින් විනිසුරුවරු සඳහා විදේශ පුහුණු අවස්ථා පිළිබඳව සොයා බැලූ අතර ආයතනයේ සියලුම විදේශ පුහුණු වැඩ සටහන් සංවිධානය කරන ලදී. ආයතනය වෙනුවෙන් සියලුම විදෙස් පුහුණ වැඩසටහන් සංවිධානය කිරිම සහ

සම්බන්ධීකරණය කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් සිදුකළ කැපවීම සහ දායකත්වය වෙනුවෙන් ඔහු වෙත හද පිරි ස්තූතිය පිරිනමන අතර ගරු අගවිනිසුරු මොහාන් පීරිස් මැතිදුන්ගේ ධුර කාලය තුළදී ආයතනය වේගවත් ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති බව ප්‍රකාශ කර සිටින්නේ ඉමහත් සතුටිනි.

සම්පත්දායී පුද්ගලයන් වශයෙන් සහ ආයතනයේ අනෙකුත් කටයුතු වෙනුවෙන් ලබා දුන් සහයෝගය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ මහාධිකරණයේ සියලුම විනිසුරුවරුන්ට අධ්‍යයන ප්‍රජාව සහ වෘත්තිකයන් සඳහාද අපගේ ගෞරව ප්‍රණාමය පුදකර සිටින්නෙමු. ආයතනයේ පුහුණු වැඩසටහන් සඳහා සහයෝගය ලබා දෙමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් කටයුතු කළ සිසිර රත්නායක මහතාටද අපගේ කෘතඥතාව පිරිනමන්නෙමු.


වර්තමානයේදී විනිශ්චයකාරවරයන්ගේ ආයතනය, අධිකරණ පුහුණුව සඳහා වූ අන්තර්ජාතික සංවිධානයේ සාමාජිකයෙකි. අධිකරණ නිලධාරීන් වෙත නෛතික සහ අධිකරණ පිළිබඳ තොරතුරු ව්‍යාප්ත කරලීම සඳහා ආයතනය වෙත වෙබ් අඩවියක් සහ ඊ - පුස්තකාල පහසුකම් සපයා ඇත. යාපනය සහ තංගල්ල මහාධිකරණ සහ ගරු අගවිනිසුරුතුමාගේ නිල මැදිරිය සම්බන්ධ කරමින් වීඩියෝ සාකච්ඡා පැවැත්වීමේ පහසුකම් ද ආයතනය සතුය. ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය සහ මහාධිකරණය මෙන්ම UA ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු සහ සාමි මන්ත්‍රී මණ්ඩලයේ නඩු තීන්දු වලින්ද සමන්විත මිලියනයකට වැඩි නඩු තීන්දු ප්‍රමාණයක් සඳහා ප්‍රවේශ විය හැකි පළමු අන්තර්ජාතික දත්ත පාදකය "මනුපත්‍ර" නම් වූ ඉන්දියානු වෙබ් අඩවිය ආයතනය විසින් මිලදී ගෙන ඇත. ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධාරීන් පුහුණු කිරීම සඳහා සහ ආයතනය වෙත ඉලෙක්ට්‍රොනික පුහුණු මෙවලම් ඇතුළු පුහුණු මොඩියුල සැපයීම සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් අධිකරණ මධ්‍යස්ථානය, මැලේසියාවේ සිංගප්පූරුව සහ ඉන්දියාවේ විනිශ්චයකාරවරයන්ගේ ආයතන විසින් ලබාදෙන ලද සහයෝගය වෙනුවෙන් ආයතනයේ කෘතඥතාව හිමිවනු ඇත. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රගතිය වෙනුවෙන් දායකත්වය ලබාදුන් ආයතනයේ කළමණාකරන මණ්ඩලය, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සහ එහි කාර්ය මණ්ඩලය, ආසියානු පදනම, ආසියානු සංවර්ධන බැංකුව සහ අරමුදල් සපයනු ලබන අනෙකුත් මුල්‍යායතන මෙන්ම ආයතනයේ කාර්යමණ්ඩලයටද ආයතනය වෙනුවෙන් ස්තූතිය පුදකර සිටිමි.

1985 – 1991 දක්වා ඓතිහාසික සිදුවීම්)
(මූලාශ්‍රය - විනිශ්චයකාරවරුන්ගේ වාර සංග්‍රහය - වෙළුම 1)

## 6. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය

මෙම ආයතනය අවිච්ඡින්න අනුප්‍රාප්තියක් සහිත සංස්ථාගත ආයතනයක් වන අතර එහි පොදු මුද්‍රාව මෙන්ම පරිපාලනය සහ කළමනාකරණය, කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී ඇත. කළමනාකරණ මණ්ඩලය අගවිනිසුරුවරයාගෙන් සහ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන විනිසුරුවරු දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ අගවිනිසුරුවරයාය. ආයතනය නැවත ප්‍රති ව්‍යුහගත කිරීමේ සැලැස්මට අනතුරුව ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය පහත සඳහන් පරිදි වේ:

## 2013 වර්ෂයේදී ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය පහත සඳහන් පරිදි විය.




ගරු අගවිනිසුරු නිලබලයෙන් පත්වන සහ අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු දෙදෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලය වෙත මෙම ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය පැවරිය යුතු බවට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනත මගින් විධිවිධාන සැලසේ.

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය -2013

### කළමනාකරණ මණ්ඩලය

**2013වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වේ:**

**ශ්‍රී ලංකාවේ ගරු අගවිනිසුරු, ජනාධිපති නීතිඥ මොහාන් පීරිස් මැතිතුමා - සභාපති**

| | |
|---|---|
| **ගරු ගාමිනි අමරතුංග මැතිතුමා,** | **සාමාජික** (2013 **අප්‍රේල් දක්වා**) |
| **ගරු සලීම් මර්සූෆ් විනිසුරුතුමා,** | **සාමාජික** |
| **ගරු ශිරාණි තිලකවර්ධන මැතිනිය,** | **සාමාජික** (2013 **අගෝස්තු මස සිට**) |

### ආයතනයේ කාර්ය මණ්ඩලය

ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සහ ආයතනයේ අධ්‍යක්ෂවරයා, නිලධාරීන් සහ සේවකයන් සම්බන්ධයෙන් විනය පාලන ක්‍රියා මාර්ග ගැනීම සඳහා (සේවයෙන් පහ කිරීමේ බලය ඇතුලත්ව) එකී කාර්ය මණ්ඩල පත් කරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලය විසිනි. තවද, අධ්‍යක්ෂවරයාගේ, නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ වේතන සහ සේවා කොන්දේසි නිශ්චය කිරීම සඳහා ද කළමනාකරණ මණ්ඩලය වෙත බලය ලබා දී ඇත.

### ආයතනයේ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| 1. අධ්‍යක්ෂ | මහාධිකරණ විනිසුරු ගරු රුවන් ප්‍රනාන්දු මැතිතුමා |
| 2. උපදේශක- | විශ්‍රාමලත් අභියාචනාධිකරන විනිසුරු ගරු රංජිත් රණරාජා මැතිතුමා, |
| 3. අධ්‍යයන සම්බන්ධිකාරක | ගරු දිස්ත්‍රික් විනිසුරු ලක්මල් වික්‍රමසූරිය මැතිතුමා |
| 4. ගණකාධිකාරි | ජී. මද්දෙගොඩගේ මහතා |
| 5. කළමනාකරණ සහකාරවරු: | දිලිනි ගන්නෝරුව මිය |
| | කපිල ජයශ්‍රී මහතා |
| | එස්.සී.පී. ලක්මාලි මෙනවිය |
| | කේ.ඒ.සි.පි.පි. ගුණවර්ධන මෙනවිය |
| 6. සුළු සේවකයන් | ඩී. ලක්ෂාන් වැලිකළ මයා |
| | ආර්.එල්.ඒ.පි. මලින්ද මහතා |
| 7. රියදුරු | ජී.ඩබ්ලිව් රංජිත් මහතා |

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය මණ්ඩල ඡායාරූපය



## 7. ආයතනයේ අරමුදල්

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය මගින් පරිපාලනය කරනු ලබන වෙනමම අරමුදලක් ආයතනය සතුය.

ආයතනයේ ප්‍රාග්ධන මෙන්ම පුනරාවර්තන වියදම් ආවරණය කරනු ලබන ප්‍රධානම මූලාශ්‍රය වන්නේ අධිකරණ අමාත්‍යාංශය හරහා සපයනු ලබන භාණ්ඩාගාර ප්‍රදානයි. අධිකරණ අමාත්‍යාංශය/ භාණ්ඩාගාරය විසින් ආයතනය වෙත වියදම් සීමාවන් පනවා ඇති අතර ආයතනය විසින් එකී සීමාවන් ඇතුලත අදාල වියදම් දැරිය යුතුය.

1985අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ විධිවිධාන ප්‍රකාර ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලබන ඕනෑම මූලාශ්‍රයක් වෙතින් ලැබෙන පරිත්‍යාග, ත්‍යාග සහ ප්‍රදාන භාර ගැනීමට ආයතනය වෙත බලය සහ අධිකාරය පවතින අතර ඕනෑම මූලාශ්‍රයක් වෙතින් ආයතනය වෙත ලැබෙන එවැනි පරිත්‍යාග, ත්‍යාග සහ ප්‍රදාන අරමුදල වෙත බැර කළ යුතුය. ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් දරන ලද සියලුම වියදම් ( වේතන ගෙවීම ඇතුලත්ව) ආයතනයේ අරමුදලින් ගෙවිය යුතුය.

ප්‍රවර්තන වර්ෂය සඳහා අධිකරණ අමාත්‍යාංශය හරහා මේ දක්වා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 6 ක් ද සහ පුනරාවර්තන වියදම් වශයෙන් රු. මිලියන 18 ක්ද ප්‍රදානය කර ඇත. විශේෂයෙන්ම පුහුණු සහ පර්යේෂණ කටයුතු පුළුල් කිරීමත් සමඟම තාක්ෂණය පදනම් වූ පුහුණු ක්‍රම සහ විදේශ පුහුණු වැඩසටහන් මෙන්ම වෙබ් අඩවි, පුස්තකාලය, වීඩියෝ සාකච්ඡා, නේවාසික පහසුකම්, ප්‍රකාශන සහ ආයතනය වෙත වාහන මිලදී ගැනීම ඇතුලුව සේවාවන් පවත්වාගෙන යාම ආදියද සිදු කරනු ලැබේ. 2015 වර්ෂයේදි ප්‍රාග්ධන වියදම් සඳහා වැඩිපුර රුපියල් මිලියන 6 ක මුදලක් සහ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 25 ක මුදලක්ද ලබා ගැනීම ආයතනයේ අපේක්ෂාවයි.

## 8. පුහුණු වැඩසටහන්

1985 වර්ෂයේදී විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටවූ දින සිට පුහුණු වැඩසටහන් සහ පුහුණු ඉඩ ප්‍රස්ථා ගණනාවක් ලබාදී ඇත. කෙසේවුවද, 2012 වර්ෂයේදි ආයතනයේ කටයුතු ව්‍යාප්ත කිරීමත් සමඟම, මහාධිකරණ විනිසුරුවරු, මූලික අධිකරණ විනිසුරුවරු සහ කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරු, කාති අධිකරණ වල විනිශ්චයකාරවරු සහ අධිකරණ රෙජිස්ට්‍රාර්වරු සඳහා වැඩසටහන් පැවැත්වීමටද අපේක්ෂා කරන ලදි. ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා (අධිකරණ කටයුතු හැදෑරීම, හැකියාවන් ඉහල නැංවීම, නිපුණතා සංවර්ධනය ඇතුලුව) ආකල්පමය වෙනසක් ඇති කිරිම සහ සමාජ වගකීම් ආදිය සම්බන්ධයෙන් සකස්කළ වැඩසටහන් හරහා අධිකරණ කාර්යසාධනය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමට ආයතනය කැපවී ක්‍රියා කරයි. අධ්‍යාපනය සහ පර්යේෂණ හරහා අධිකරන පරිපාලනය සහ කළමනාකරණය ඉහළ මට්ටමකට සංවර්ධනය කිරිමට සහ භාවිතයේ යෙදවීමටද ආයතනය කැපවී ක්‍රියා කරයි. මෙම වැඩසටහන් හරහා ආයතනය අපේක්‍ෂා කරනුයේ අධිකරණ සේවා කොමිෂන් සභාව යටතට අයත් වන මූල් අධිකරණ විනිශ්චයකාර වරු සහ කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ගේ පුහුණු අවශ්‍යතාවන් සපුරා ලීමයි.

සියලුම සහභාගිවන්නන් සඳහා අදාල වන පොදු පුහුණු වැඩසටහන් තිබුණද පුහුණ මොඩියුල සහ පුහුණුව සඳහා සහභාගිවන්නන්ගේ විවිධත්වය මත පුහුණු අවශ්‍යතාවන් වෙනස් වේ. කලින් පවත්වන ලද පුහුණු

සැසිවාර වලදී අධිකරණ නිලධාරීන් විසින් ලබා ඇති පුහුණු මාදිලි හෝ ඔවුහු අත්පත් කරගත් දැනුම මත අදාළ පුහුණු වැඩ සටහන අනිවාර්ය වීමට හෝ ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වීම සිදු කළ හැකිය.

පුහුණු වැඩසටහන් පාලනය කිරීම සඳහා බලය ඇත්තේ කාටද, සහ පුහුණු වැඩසටහන් සඳහා මූල්‍ය සැපයිය යුත්තේ කෙසේද ඉලක්කගත කණ්ඩායම් කවුරුන්ද සහ පුහුණු වැඩසටහනේ කාල පරිච්ඡේදය කොතෙක්ද යන පැනයද මේ මගින් ආවරණය වේ.

අධිකරණ නිලධාරීන්ගේ වෘත්තිය විශේෂඥතාව ඉහළ නැංවීම සඳහා සහ ඔවුන්ගේ වෘත්තිය කාල පරිච්ඡේදය මුළුල්ලේ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ සියලුම අධිකරණ නිලධාරීන් අනිවාර්ය සේවාස්ථ පුහුණුවකට සහභාගි වීම අවශ්‍ය කෙරේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේදි සෑම සෙනසුරාදා දිනකම එකී ආයතනය විසින් පවත්වනු ලබන සේවාස්ථ පුහුණ වැඩසටහන් සඳහා ඔවුන් සහභාගි විය යුතුය. එසේ සහභාගි වීමට යම් නොහැකියාවක් පවතින අවස්ථාවකදි එකී අනිවාර්ය සේවාස්ථ පුහුණු සැසි සඳහා සහභාගි විමට ඇති නොහැකියාව පිළිබඳව ඔවුන් විසින් ආයතනයට දැනුම් දීම අවශ්‍ය කෙරේ.

අළුතින් පත්කරන ලද පුහුණවන අධිකරණ නිලධාරීන් සඳහා දිනෙන් දින හඳුන්වාදීමේ සහ මූලික පුහුණු වැඩසටහන් පවත්වනු ලබන අතර එකී පුහුණු වැඩ සටහන් අනිවාර්ය වේ. විනිශ්චයකාරවරුන්ගේ ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු සැසිවාර සඳහා සහභාගි නොවී සිටීමට ඔවුන්ට අවකාශ නොමැත.

සේවාස්ථ පුහුණුවට යටත් අධිකරණ නිලධාරින්ගේ වැඩිදුර පුහුණුව සඳහා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වෙත සම්බන්ධ කිරිමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ විටෙක වෙනත් මාදිලියේ පුහුණු අවශයතාවන් පැන නැගුණි.

## පුහුණු වැඩසටහන් වල ස්වභාවය

### 1. අනිවාර්ය පුහුණුව

සේවා ස්ථ පුහුණුව සහ පුහුණුවන අධිකරණ නිලධාරීන් සඳහා දැනට පවත්වාගෙන යනු ලබන අනිවාර්ය අධිකරණ පුහුණුව අඛන්ඩව පවත්වාගෙන යනු ලබන අතර ඉහතින් සඳහන් කර ඇති පරිදි සේවාස්ථ පුහුණුව ලබන අධිකරණ නිලධෘරීන් සඳහා විකල්ප සහ ස්වේච්ඡා පුහුණු වැඩ සටහන් ද වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. කෙසේ වුවද අධිකරණ නිලධාරීන්ගේ අවශ්‍යතාවන් සහ තාක්ෂණය පදනම් වු ප්‍රතිමුඛ දුරස්ථ අධ්‍යාපනය සහ ස්වයං අධ්‍යන අධිකරණ පුහුණුව පිළිබඳව සැලකිල්ල යොමු කරමින් අනෙකුත් අධිකරණ බල සීමාවන්හි සිදුකරනු ලබන වෙනස්කිරීම් කෙරෙහි ද අවධානය යොමු කරමින් අධිකරණ පුහුණුව සඳහා නව ප්‍රවේශයක් හඳුන්වා දෙනු ඇත.

## 2. විකල්ප පුහුණු වැඩසටහන්

ගුණාත්මක බව සහ අධිකරණ නිලධාරීන්ගේ අවශ්‍යතාවන් මත අධිකරණ කටයුතු සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ලේඛන ලිවීම, පෞරුෂත්ව සංවර්ධනය, පරිගණක පුහුණුව, සෞඛ්‍යය සංවර්ධනය වැනි අනෙකුත් අධිකරණ බල සීමාවන්හි සිදුකරන ආධාරක පාඨමාලා සඳහා වූ අවශ්‍යතාවන් විකල්ප පාඨමාලා වශයෙන් සළකා බලනු ලැබේ.

## 3. පුහුණු කාල පරිච්ඡේදය

නිලලත් හෝ නිල නොලත් නීතිඥ සංගමයක නීතිඥවරයකු වශයෙන් වෘත්තියේ යෙදී සිටිමින් මූලික අනිවාර්ය කාල පරිච්ඡේදය සම්පූර්ණ කර ඇති නීතිඥයන්ගෙන් අධිකරණ නිලධාරීන් තෝරා ගැනෙන අතර, අනෙකුත් රටවල විනිසුරුවරු වැඩි සංඛ්‍යාවක් තෝරා ගැනෙන්නේ ඉතා ඉහළ මට්ටමේ ස්වයං සංවර්ධනයක් හෝ පුහුණුවක් ලබා ඇති ශාස්ත්‍රඥයින් අතුරිනි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සළකා බැලීමේදි, අධිකරණ පුහුණුව සාමාන්‍යයෙන් මාස 6 කට සීමා වන අතර සිවිල් නීති අධිකරණ බල සීමාවන් සම්බන්ධයෙන් සැලකීමේදී ඒවායේ ඇගයීම් ක්‍රමයක්ද සහිත වන අතර මූලික පුහුණු කාලය ද දීර්ඝ කළ හැකිය. අනිවාර්ය ඉදිරිපත් කිරීම්, පර්යේෂණ කාර්යයන් සහ නිබන්ධන ඉදිරිපත් කිරිම ද ඇතුලත්ව වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා මෙම මොඩියුලය දීර්ඝ කළ යුතු බවට යෝජනා කර ඇත.

## 4. පුහුණුව ලබාදෙන ආයතන

වර්තමානයේදී අධිකරණ පුහුණුව ලබාදෙනු ලබන්නේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය මගිනි. කෙසේවුවද, රජයේ නියෝජිතායතන හෝ විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන සමහර විශේෂිත පුහුණු වැඩ සටහන් අධිකරණ නිලධාරීන් සඳහා ද අදාල වන හෝ ප්‍රයෝජනවත් වන අවස්ථාවලදී එකී වැඩ සටහන් පැවැත්වීමට විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් ඊට අනුමැතිය ප්‍රදානය කරයි. විදේශ පුහුණුවද අවශ්‍ය වන අවස්ථාවන්හිදී එම පුහුණු සැසිවාර, විදේශීය විශ්ව විද්‍යාලයක් විසින් හෝ අධිකරණ අධ්‍යයනායතනයක් හෝ විශේෂිත පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලැබේ. .

## 5. පුහුණුකරුවන්

වර්තමානයේදී ප්‍රධාන වශයෙන්ම පුහුණු වැඩ සටහන් පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවරු විසිනි. කෙසේවුවද නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් විසින්ද විවිධ මාදිලියේ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. අධිකරණ නිලධාරීන් සම්බන්ධයෙන් වැදගත් වන ආකාරයේ දැනුම, පළපුරුද්ද සහ විශේෂඥතාවකින් යුත් විශිෂ්ට මට්ටමේ නිතිවේදීන් සහ විද්වතුන් වෙතද අධිකරණ පුහුණු වැඩ සටහන් පැවැත්වීම සඳහා ආරාධනා කෙරේ. පුහුණුවන අධිකරණ නිලධාරීන් සම්බන්ධයෙන් සළකා බැලීමේදී බොහෝ විට ඔවුන්ගේ පුහුණු පාඨමාලා ප්‍රධාන වශයෙන්ම සිදු කරනු ලබන්නේ දැනට සේවයේ නියුතු සහ විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරුවරු සහ මහාධිකරණ විනිසුරුවරු විසින් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් විසිනි. හඳුනාගැනීමේ පෙරෙට්ටු, මරණ පරීක්ෂණ සහ ප්‍රකාශ වාර්තා කිරීම ආදි ප්‍රායෝගික පුහුණු ක්‍රියාකාරකම් සඳහා සහ විවාදාත්මක අධිකරණ සැසි සඳහා ජ්‍යෙෂ්ඨ මහේස්ත්‍රාත්වරු වෙතද ආරාධනා කෙරේ. පරිගණක පාඨමාලා විද්‍යුත් ලිපි ගොනු පවත්වාගෙන යාම, මානසික සංවර්ධනය, අධිකරණ වෛද්‍ය විද්‍යා පාඨමාලා ආදී ආධාරක වැඩසටහන් එකී ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති බාහිර පුහුණු කරන්නන් විසින් සිදු කරනු ඇත.


## පුහුණු පහසුකම් හා සම්පත්

පහතින් සඳහන් කර ඇති පහසුකම් ඇතුලත්ව මෙම ග්‍රන්ථයේ සඳහන් කර ඇති අධිකරණ පුහුණු පාඨමාලා පැවැත්වීම පිණිස දැනට ආයතනය සතුව ඇති නවීන පහසුකම් පවතී.:

1. අති නවීන පහසුකම් වලින් සමන්විත ශ්‍රවනාගාරය;
2. Wi-Fi පහසුකම් සහිත අති නවින පහසුකම් වලින් සමන්විත පුස්තකාලය ( සඳුදා සිට සෙනසුරාදා දක්වා විවෘතව පවතී);
3. වෙබ් අඩවි;
4. වීඩියෝ සාකච්ඡා
5. ඡායා පිටපත් සහ මුද්‍රිත පිටපත් පහසුකම;
6. පරිශීලන නීති පොත්;
7. පාඨමාලා ග්‍රන්ථ;
8. පරිශීලන ග්‍රන්ථ;
9. නීති වාර්තා;
10. වාර්තා නොකළ නඩු තීන්දු;
11. නේවාසික පහසුකම්;
12. නෛතික තොරතුරු ඇතුලත් දත්ත පාදක



**පුස්තකාලය**



ශ්‍රවණාගාරය




**විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු රංජිත් රණරාජා මැතිතුමා විසින් අධිකරණ නිලධාරීන් සඳහා පුහුණු සැසි පැවැත්වීම.**



**මහාධිකරණ විනිසුරුවරු සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වීම**

## පුහුණු පාඨමාලා මාදිලි

1) අධිකරණ නිලධාරීන්, දිස්ත්‍රික් විනිසුරුවරු සහ මහෙස්ත්‍රාත්වරු සඳහා සේවාස්ථ පුහුණු පාඨමාලා;
2) කම්කරු විනිශ්චය සභා වල සභාපතිවරු සඳහා සේවාස්ථ පුහුණු පාඨමාලා;
3) මහාධිකරණ විනිසුරුවරු සඳහා සේවාස්ථ පුහුණු වැඩ සටහන්;
4) පුහුණුවන අධිකරණ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු පාඨමාලා
5) අළුතින් පත්වූ පහුණුවන කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සඳහා සේවාරම්භක / මූලික පුහුණු පාඨමාලා;
5) කාති අධිකරණ වල සභාපතිවරු /කාතිවරු සඳහා සේවාස්ථ පුහුණු පාඨමාලා;
6) කාති අධිකරණ වල සභාපතිවරු / කාතිවරු සඳහා සේවාස්ථ පුහුණු පාඨමාලා;
7) සේවාස්ථ සහ පුහුණුවන අධිකරණ නිලධාරීන් සඳහා පරිගණක පාඨමාලා;
8) සේවාස්ථ කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සඳහා පරිගණක පාඨමාලා;
9) අධිකරණ නිලධාරීන්, කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සහ මහාධිකරණ විනිසුරුවරු සඳහා පර්යේෂණ ක්‍රමවේදය සහ පරිගණකගත පර්යේෂණ පාඨමාලා;
10) අධිකරණ නිලධාරීන් සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ලිවීමේ හැකියාවන් වර්ධනය කිරීමේ පාඨමාලා සහ ලතින් භාෂාව පිළිබඳ පාඨමාලා;
11) කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ලිවීමේ හැකියාවන් සංවර්ධනය කිරිම සහ ලතින් භාෂාව පිළිබඳ පාඨමාලා;
12) අධිකරණ නිලධාරීන් සඳහා අධිකරණ චර්යාවන්, ආකල්පමය වෙනස්කම් සහ අධිකරණ කටයුතු පිළිබඳ නිපුණතාවන් සංවර්ධනය කිරීම පිළිබඳ පාඨමාලා;
13) කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සඳහා අධිකරණ චර්යාවන්, ආකල්පමය වෙනස්කම් සහ අධිකරණ හැකියාවන් සංවර්ධනය පිළිබඳ පාඨමාලා;

14) අධිකරණ නිලධාරීන් සඳහා පෞරුෂත්ව සංවර්ධනය සහ සෞඛ්‍යය සංවර්ධන පාඨමාලා;
15) කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සඳහා පෞරුෂත්ව සංවර්ධනය සහ සෞඛ්‍යය සංවර්ධනය පිළිබඳ පාඨමාලා;
16) අධිකරණ නිලධාරීන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සඳහා නඩු තීන්දු ලිවීමේ පාඨමාලා;
17) මහාධිකරණ විනිසුරුවරු සඳහා පෞරුෂත්ව සංවර්ධනය සහ සෞඛ්‍යය සංවර්ධනය පිළිබඳ පාඨමාලා;
18) අධිකරණ වෛද්‍ය විද්‍යාව සහ විෂවේදය;
19) අධිකරණ නිලධාරීන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සඳහා ගැටුම් විසඳීමේ විකල්ප ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලා;
20) පළාත්බඳව සේවය කරන අධිකරණ නිලධාරින් දිස්ත්‍රික් විනිසුරුවරු සහ මහෙස්ත්‍රාත්වරු සඳහා පළාත්බද පාඨමාලා ;
21) සියලුම අධිකරණ නිලධාරීන්, දිස්ත්‍රික් විනිසුරුවරු මහෙස්ත්‍රාත්වරු සහ පුහුණුවන අධිකරණ නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ;
22) කම්කරු විනිශ්චය සභා සභාපතිවරු සඳහා සම්මන්ත්‍රණ;
23) මහාධිකරණ විනිසුරුවරු සඳහා සම්මන්ත්‍රණ;

## මෙම පාඨමාලාවේ අරමුණු හා පරමාර්ථ පහතින් සඳහන් කර ඇත:

1) තනතුරේ ගරුත්වය පිළිබඳව සහ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී විනිසුරුවරුන්ගේ කාර්ය භාරය අවබෝධ කරදීම.
2) මහජනතාවගේ අධිකරණ ක්‍රියාකාරකම් සහ බාහිර නීති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මහජන විශ්වාසය බිඳවැටීම අවම කිරීම සඳහා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී අධිකරණ නිලධාරීන් සඳහා වූ ආචාර ධර්ම පද්ධතියක වැදගත්කම අවබෝධ කර දීම;
3) නඩුකියන්නන් සහ මහජනතාවගේ සැකය ඉක්මවා පුද්ගලික කටයුතු කළමනාකරණය කරගැනීම සඳහා මූලික සම්මතයන් අවබෝධ කර දීම;
4) අධිකරණ නිලධාරීන්, නඩු කියන්නන් සහ මහජනතාව ආදින් සමඟ කටයුතු කිරීම ඇතුලත්ව අධිකරණ චර්යාවන් සම්බන්ධ රීති සහ අධිකරණ කටයුතු පිළිබඳ නිපුණතාවන් අවබෝධ කර දීම..
5) අධිකරණ නිලධාරින් සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය සංවර්ධනය කිරීම. (ලිඛිත චර්යා ධර්ම පද්ධතියක් හෝ ලිඛිත නොවූ ස්වයං පාලන ආචාර ධර්ම පද්ධතියක් යටතේද යන බව).

## සේවාස්ථ පුහුණු පාඨමාලාවල අන්තර්ගතය

1. අධිකරණ චර්යාවන්, ආචාර ධර්ම සහ පැවැත්ම
2. මූලික නෛතික දැනුම (හරවත් සහ පරිපාටික නීතිය, අපරාධ, සිවිල්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා, වානිජ නීතිය, අපරාධ සහ සිවිල් නඩු විධානය, සාක්ෂි නීතිය);
3. විශේෂ නීති සහ පනත්;
4. පුද්ගල නීතිය;
5. මානව අයිතිවාසිකම්;
6. දූෂණ විරෝධී නීති;
7. පරිගණක හැකියාවන් සහ තොරතුරු තාක්ෂණය;
8. බුද්ධිමය දේපළ;
9. අධිකරණ පරිපාලනය සහ අධිකරණ කළමනාකරණය;
10. සිද්ධි කළමනාකරණය සහ සිද්ධි ප්‍රවාහ කළමනාකරණය;
11. ගිනුම් සහ මූල්‍යය;
12. විනය ක්‍රියා පටිපාටිය;
13. ළමා යුක්තිය;
14. යුක්තිය සහ නීති ආධාර වෙත පිවිසීම;
15. අධිකරණ විද්‍යාව සහ අධිකරණ වෛද්‍ය විද්‍යාව;
16. නඩු තීන්දු ලිවීම;
17. දණ්ඩන ප්‍රතිපත්ති සහ භාවිතය;
18. පර්යේෂණ ක්‍රමවේදය සහ පරිගණක ගත පර්යේෂණ ක්‍රමවේදය;
19. ගැටුම් විසඳීමේ විකල්ප ක්‍රම;
20. පෞරුෂත්වය සහ හැකියාවන් සංවර්ධනය;
21. සෞඛ්‍යය සංවර්ධනය සහ මානසික පීඩනය කළමනාකරණය;
22. ප්‍රායෝගික පුහුණුව - නඩු තීන්දු ලිවීමේ භාවිතයන්, විසඳිය යුතු ප්‍රශ්ණ කෙටුම්පත් කිරීම, චෝදනා ගොනු කිරීම, හඳුනාගැනීමේ පෙරෙට්ටු, මරණ පරීක්ෂණ පැවැත්වීම, පාපොච්චාරණ සහ ප්‍රකාශ වාර්තා කිරීම, විමර්ශන සටහන් සකස් කිරීම.

## පුහුණු ක්‍රම

1. මධ්‍යගත ප්‍රතිමුඛ ක්‍රමය;
2. විමධ්‍යගත/පළාත් පදනම් වූ ප්‍රතිමුඛ ක්‍රමය;
3. අධිකරණ පදනම් වූ උපදේශන ක්‍රම;
4. පත්කරන ලද උපදේශකයන් විසින් පවත්වනු ලබන මධ්‍යගත උපදේශණ ක්‍රම. ( පත්කරන ලද සම්පත් දායීන්)
5. තනි නිලධාරීන් සඳහා ප්‍රවාහ ක්‍රම
6. තොරතුරු තාක්ෂණය සහ වෙබ් පදනම් වූ දුරස්ථ අධ්‍යාපන ක්‍රම
7. දිනපතා භාවිතයේ පවතින උපකරණ, නඩු පොත්, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍ය අධ්‍යාපනික වැඩ සටහන්
8. මොඩියුල
9. පාඨමාලා ග්‍රන්ථ
10. පරිශීලන ග්‍රන්ථ
11. පර්යේෂණ පත්‍රිකා
12. වීඩියෝ සාකච්ඡා

13. ප්‍රායෝගික ක්‍රම, සභා ශාලා
14. සංචාර
15. ප්‍රදර්ශනය කිරීම්
16. රචනා ලිවීම
17. පර්යේෂණ කාර්යයන්
18. තනිව අධ්‍යයනය කරන පාඨමාලා ග්‍රන්ථ සකස් කිරීම
19. විදේශීය පුහුණු ක්‍රම
20. උපදේශනය;

උපදේශන පුහුණු වැඩසටහන් මාදිලි 2ක් යටතේ පැවැත්වෙන අතර එම වැඩසටහන් දෙකම අධිකරණය පදනම් වු උපදේශන වැඩ සටහන් වලින් සමන්විත වනු ඇත. ප්‍රධාන විනිසුරු විසින් පවත්වනු ලබන උපදේශන වැඩසටහන සහ සම්පත්දායී පුද්ගලයන් විසින් පවත්වනු ලබන මධ්‍යගත උපදේශන වැඩසටහන් ඒ යටතේ දැක්විය හැකිය. කිසිදු නිල පිළිගැනීමක් නොමැතිව පුද්ගල මට්ටමේ පුහුණුවක් වශයෙන් උපදේශණය අපේ රට තුල භාවිතා කෙරෙන බව සියලුදෙනා දන්නා කරුණකි. නව පුහුණු අත්පොත මගින් උපදේශන පුහුණු වැඩසටහන් හඳුන්වාදෙන අතර එමගින් අධිකරන නිලධාරීන් මහාධිකරණ විනිසුරුවරු සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරු වෙත විශේෂඥ හැකියාවන් සහිත සම්පත්දායී පුද්ගලයන් දෙදෙනෙකු විසින් (විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු හෝ අභියාචනාධිකරණ විනිසරුවරු) උපදෙස් ලබා දෙනු ඇත. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් එම උපදේශන පැවැත්වෙනු ඇත.:

(1) අපරාධ නීතිය සහ සාක්ෂි - මුල් සහ අභියාචනා - උපදේශකවරු (01) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයෙක්

(2) සිවිල් නීතිය සහ කම්කරු නීතිය - මුල් සහ අභියාචනා - උපදේශකවරු (01) විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු හෝ අභියාචනාධිකරණ විනිසුරුවරයකු විසින්)

මෙම මාදිලියේ පුහුණු ක්‍රම ප්‍රධාන වශයෙන්ම පවත්වනු ලබන්නේ කලින් සුදානම් කළ දුරකථන ඇමතුම්, ඊමේල් පණිවුඩ, වෙබ් පදනම් වු සන්නිවේදන ක්‍රම, මෙන්ම කලින් සුදාකම් කළ ප්‍රතිමුඛ සාකච්ඡා ආකාරයේ ආයතනික සැසිවාර හරහාය.

21. **ඊ - පුස්තකාලය**



ඊ පුස්තකාලය පහත සඳහන් දෑ වලින් අන්තර් ගත වි ඇත..



# 9. 2013 වසර දෙස ආපසු හැරී බලමු

විනිශ්චයකාරවරයන්ගේ ආයතනය - 2013

- අධිකරණ අමාත්‍යාංශයට අයත් නව ගොඩනැගිල්ලේ වෙනම අංශයක ලේකම් කාර්යාලය පිහිටුවන ලදී.
- අධිකරණ නිලධාරීන් දිස්ත්‍රික් විනිසුරුවරු සහ මහේස්ත්‍රාත්වරු 1315 දෙනෙකු සඳහා සේවාස්ථ සම්මන්ත්‍රණ 26 ක් පවත්වන ලදී.
- මහාධිකරණ විනිසුරුවරු 67 දෙනෙකු සඳහා සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
- කම්කරු විනිශ්චය සභා සභාපතිවරු 105 දෙනෙකු සඳහා සම්මන්ත්රණ 3 ක් පවත්වන ලදී.
- සිද්ධි කළමනාකරණය සහ විද්‍යුත් බැංකුකරණය සහ ඉලෙක්ට්‍රොනික ඇමතුම් සම්බන්ධයෙන් අධිකරණ නිලධාරීන් 217 දෙනෙකු සඳහා වැඩමුලු 3ක් පවත්වන ලදී
- www.judgesinstitute.lk වෙබ් අඩවිය ආරම්භ කරන ලදි.
- www.judgesinstitute.lk ඊ - පුස්තකාලය ආරම්භ කරන ලදී
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ආයතනයේ සේවක සංඛ්‍යාව අනුමත කරන ලදී.
- වීඩියෝ සාකච්ඡා පහසුකම් ඇති කරන ලදී.
- ශ්‍රවණාගාරය පූර්ණ වායු සමීකරණ පහසුකම් සහිතව නවීකරණය කරන ලදී.
- පුහුණුවන අධිකරණ නිලධාරීන්ගේ සහාය ඇතුව පාඨමාලා ග්‍රන්ථ සහ පරිශීලන ග්‍රන්ථ සකස් කරන ලදී.
- ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය විසින් වාර්තා නොකළ නඩු තීන්දු රැස්කර පරිශීලනය සඳහා පුස්තකාලයේ තබන ලදී.
- විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ප්‍රසම්පාදන කමිටුව පිහිටුවන ලද අතර මෙම කාල පරිච්ඡේදය තුලදී රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.
- අධිකරණ නිලධාරීන් අතර මුද්‍රිත සහ ඡායා පිටපත් කළ අත්පත්‍රිකා සහ පරිශීලන පත්‍රිකා 750 ක් බෙදාහරින ලදී.
- පරිශීලන පුස්තකාලය නවීකරණය කරන ලදී.
- මහාධිකරණ විනිසුරුවරු වෙත පුහුණු වැඩසටහන් දීර්ඝ කරන ලදී.
- ඒකාබද්ධ සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරන ලදී.
- විදේශීය විනිසරුවරයකු විසින් ආරාධිත දේශණයක් පවත්වන ලදී.
- විදේශීය විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයකු විසින් ආරාධිත දේශණයක් පවත්වන ලදී.
- විනිශ්චයකාරවරුන්ගේ පුහුණු අත්පොත් සකස් කරන ලදී.
- අධිකරණ පුහුණුව පිළිබඳ අන්තර්ජාතික සංවිධානයේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී.
- වොෂිංටන්හි පවත්වන ලද අධිකරණ පුහුණුව පිළිබඳ 6 වන අන්තර්ජාතික සමුළුවට සහභාගි වන ලදී.
- පුස්තකාලය සහ තාක්ෂණය පදනම් වූ පුහුණු වැඩසටහන් ඉහළ මටටමකට රැගෙන ඒම සඳහා ඉලෙක්ට්‍රොනික උපකරණ සහ ලී බඩු මිලදී ගන්නා ලදී.
- විනිසුරුවරු 80 දෙනෙකු සඳහා මැලේසියාවේ අධිකරණ පුහුණු ආයතනයේ හා බෝපාල්හි පිහිටි ඉන්දියානු අධිකරණ ඇකඩමියේ විදේශ පුහුණු වැඩසටහන් 2 ක් සංවිධානය කරන ලදී.
- Criminal procedure digest මිලදී ගෙන සියලුම මහෙස්ත්‍රාත් වරු වෙත බෙදා දෙන ලදී.
- පුස්තකාලය සඳහා නීති වාර්තා මිලදි ගන්නා ලදී.

# 10 . 01.01.2013- 31.12.2-2013 දක්වා කාල පරිච්ඡේදය තුල ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනයේ ක්‍රියාකාරකම්

## 1. ජ්‍යෙෂ්ඨ විනිසුරුවරු සඳහා සෙනසුරාදා දිනයන්හි පැවැත්වෙන වැඩසටහන්

.2013.01.01 සිට 2013.12.31 දක්වා කාල පරිච්ඡේදය තුල සෙනසුරාදා දිනයන්හි සම්මන්ත්‍රණ පැවැත්වූ අතර ඒ සඳහා මහාධිකරණ විනිසුරුවරු 67ක්ද අධිකරණ නිලධාරීන් 1315 ක් ද කම්කරු විනිශ්චය සභා සභාපතිවරු 70 ක් ද සහභාගි විය 2013 වර්ෂය තුලදී ආයතනය සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් පහතින් දැක්වේ:

**මහෙස්ත්‍රාත්වරු සහ දිස්ත්‍රික් විනිසුරුවරු සඳහා සෙනසුරාදා දිනයන්හි පහත සඳහන් සම්මන්ත්‍රණ පවත්වන ලදී:**

| අංකය. | දිනය | දේශක | මාතෘකාව | විනිසුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | 2013.01.12 | විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු ගරු රංජිත් සිල්වා මැතිතුමා | අධිකරණ නීති කෘත්‍යයන් වලදි ලේඛනගත සාක්ෂිවල ආවේශ්‍යතාව | 53 |
| 2 | 2013.01.19 | ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු සලීම් මරුසුෆ් මැතිතුමා | අධිකරණ නීති කෘත්‍යයන් වලදි ඉලෙක්ට්‍රොනික සාක්ෂි වල ආවේශ්‍යතාව | 47 |
| 3 | 2013.02.09 | විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු ගරු රංජිත් සිල්වා මැතිතුමා | අධිකරණ නිති කෘත්‍යයන් වලදී ලේඛන ගත සාක්ෂිවල ආවේශ්‍යතාව | 55 |
| 4 | 2013.02.16 | අභියාචනාධිකරණ විනිසුරු ගරු ඒ.ඩබ්ලිව්.ඒ. සලාම් මැතිතුමා | සිවිල් නිති කෘත්‍යයන් වලදී පූර්ව නඩු විභාග පියවරයන් | 48 |
| 5 | 2013.03.02 | අභියාචනාධිකරණ විනිසුරු ගරු ඒ.ඩබ්ලිව්.ඒ. සලාම් මැතිතුමා | සිවිල් නිති කෘත්‍යයන් වලදී පූර්ව නඩු විභාග පියවරයන් | 47 |
| 6 | 2013.03.09 | ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු සලීම් මර්සුෆ් මැතිතුමා | අධිකරණ නීති කෘත්‍යයන්හිදී ඉලෙක්ට්‍රොනික සාක්ෂි වල ආවේශ්‍යතාව | 49 |
| 7 | 2013.03.23 | නියෝජ්‍ය නීතිපති බුවනෙක අළුවිහාරේ මහතා | ශ්‍රැතිමාත්‍රය සහ ව්‍යතිරේඛයන්ට එරෙහි රීතිය | 53 |
| 8 | 2013.03.30 | නියෝජ්‍ය නීතිපති බුවනෙක අළුවිහාරේ මහතා | ශ්‍රැතිමාත්‍රය සහ ව්‍යතිරේඛ | 53 |

| | | | | |
|---|---|---|---|---|
| 9 | 2013.05.04 | **ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු සලීම් මර්සුෆ් මැතිතුමා** | අධිකරණ නීති කෘත්‍යයන්හිදී ඉලෙක්ට්‍රොනික සාක්ෂිවල අවේශ්‍යතාව | 55 |
| 10 | 2013.06.01 | **අභියාචනාධිකරණ විනිසුරු ගරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා** | මුදල් අයකරගැනීම සම්බන්ධ ව්‍යවස්ථා | 47 |
| 11 | 2013.06.08 | **අභියාචනාධිකරණ විනිසුරු ගරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා** | මුදල් අයකරගැනීම සම්බන්ධ ව්‍යවස්ථා | 44 |
| 12 | 2013.06.15 | **විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු ගරු රංජිත් සිල්වා මැතිතුමා** | අධිකරණ පරිපාලනය සහ විනයානුකූල ක්‍රියාමාර්ග | 51 |
| 13 | 2013.06.22 | **විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු ගරු රංජිත් සිල්වා මැතිතුමා** | අධිකරණ පරිපාලනය සහ විනයානුකූල ක්‍රියාමාර්ග | 54 |
| 14 | 2013.07.06 | **ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු චන්ද්‍රා ඒකනායක මැතිතුමා** | සිවිල් නඩු සම්බන්ධයෙන් නඩු තීන්දු ලිවීම | 52 |
| 15 | 2013.07.13 | **ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු චන්ද්‍රා ඒකනායක මැතිතුමා** | සිවිල් නඩු සම්බන්ධයෙන් නඩු තීන්දු ලිවීම | 44 |
| 16 | 2013.08.03 | **ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු ශිරාණි බණ්ඩාර නායක මැතිනිය** | ගෘහස්ත ප්‍රචණ්ඩත්ව පනත සහ කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වය | 55 |
| 17 | 2013.08.31 | **ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා** | තෙවන පාර්ශවයේ රථවාහන රක්ෂණය සහ නෛතික ගැටලු | 45 |
| 18 | 2013.09.07 | **අතිරේක නිතිපති විජිත් මලල්ගොඩ මහතා** | විෂවර්ග අබින් සහ අන්තරායකර ඖෂධ පනත යටතේ නෛතික ගැටලු | 51 |
| 19 | 2013.09.14 | **ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා** | තෙවන පාර්ශවයේ රථවාහන රක්ෂණය සහ නෛතික ගැටලු | 50 |
| 20 | 2013.09.21 | **අතිරේක නිතිපති විජිත් මලල්ගොඩ මහතා** | විෂවර්ග අබින් සහ අන්තරායකර ඖෂධ පනත යටතේ නෛතික ගැටලු | 54 |
| 21 | 2013.10.05 | **ආචාර්ය කේ.එම්. කරුණාරත්න මහතා** | අපරාධ ක්‍රියා සම්බන්ධයෙන් බුද්ධිමය දේපල නිති බලගැන්වීම | 51 |
| 22 | 2013.10.12 | **ආචාර්ය රුවන් ඉලේපෙරුම මහතා** | අපරාධ විමර්ශන වලදී DNA තාක්ෂණය යොදා ගැනීම. | 54 |

| | | | | |
|---|---|---|---|---|
| 23 | 2013.10.19 | **ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු සලීම් මර්සූෆ් මැතිතුමා** | අධිකරණ නීති කෘත්‍යයන් හිදී ඉලෙක්ට්‍රොනික සාක්ෂි වල ආවේශ්‍යතාව | 52 |
| 24 | 2013.10.26 | **ආචාර්ය රුවන් ඉලේපෙරුම මහතා** | අපරාධ විමර්ශන වලදී DNA තාක්ෂණය යොදා ගැනීම | 50 |
| 25 | 2013.11.23 | **ආචාර්ය කේ.එම්. කරුණාරත්න මහතා** | අපරාධ ක්‍රියා සම්බන්ධයෙන් බුද්ධිමය දේපල නීති බලගැන්වීම | 54 |
| 26 | 2013.12.07 | **ආචාර්ය කේ.එම්. කරුණාරත්න මහතා** | බුද්ධිමය දේපළ නීතිය | 45 |
| **26** | | | | 1315 |

## වැඩමුළු

පලදායි සිද්ධි කළමනාකරණය සඳහා නූතන චර්යාවන් සහ නිති ප්‍රමාදය වැළැක්වීම සම්බන්ධයෙන් අධිකරණ නිලධාරීන් 91 දෙනෙකු සඳහා 2013 අගෝස්තු 8-10 දින දක්වා ඊඩන් ගාඩින්ස් හෝටලයේදී ද සහ 2014 අගෝස්තු මස 16-18 දින දක්වා අලුත්ගම, කලුවාමෝදර ඊඩන් රිසෝට් ඇන්ඩ් ස්පාහිදී වැඩමුලු 2ක් පවත්වන ලදී. ඉලෙක්ට්‍රොනික බැංකුකරණය සහ ඉලෙක්ට්‍රොනික ගිවිසුම් පත්‍ර සම්බන්ධයෙන් දිස්ත්‍රික් විනිසුරුවරු 126 දෙනෙකු සඳහා කොළඹ මිලෝදා ශාලාවේදී 2013.11.30 වන දින වැඩමුළුවක් පවත්වන ලදී.

## විදේශීය පුහුණු වැඩසටහන්

අධිකරණ ආචාර ධර්ම, අධිකරණ පරිපාලනය, සිද්ධි කළමනාකරණය සහ අධිකරණ කටයුතු ස්වයංක්‍රීයකරණය සහ පලදායි අධිකරණයක් සහ සිද්ධි කළමනාකරණය සඳහා අධිකරණ හැකියාවන් ඉහළ නැංවීම සම්බන්ධයෙන් සහභාගිවන්නන්ගේ දැනුම් වර්ධනය කිරීම සඳහා 2014 ඔක්තෝබර් 28 දින සිට 2014 නොවැම්බර් 01 දින දක්වා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරු 39 දෙනෙකු වෙනුවෙන් මැලේසියාවේ අධිකරණ නීති පුහුණු ආයතනයේදී විදේශීය පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය විසින් මෙම පුහුණු වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී.

## 11. විදේශීය විනිශ්චයකාරවරු සහ විදේශීය සම්පත්දායී පුද්ගලයන් විසින් පවත්වන ලද ආරාධිත දේශණ

වඩාත් පලදායී අධිකරණ කළමනාකරණයක් සම්බන්ධයෙන් වර්තමානයේදී ඔස්ට්‍රේලියානු රජය විසින් ගෙන ඇති පියවර සහ සිද්ධි කළමනාකරණය සම්බන්ධයෙන් "මෑතකාලීන සංවර්ධනයන්" යන මැයෙන් 2013.09.16 වන දින **ඔස්ට්‍රේලියාවේ ෆෙඩරල් සංචාරක අධිකරණයේ විනිසුරු මයිකල් බෝමාන් මැතිතුමා** විසින් කොළඹ අධිකරණ කලාපයේ විනිශ්චයකාරවරු 60 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා විනිශ්‍ාචයකාරවරුන්ගේ ආයතනයේ ශ්‍රවණාගාරයේදී දේශණයක් පවත්වන ලදී.



'වානිජ නීතිය සම්බන්ධයෙන් තරඟකාරිත්ව නීතියේ සංවර්ධනයන්" යන මැයෙන් 2014.10.04 දින **එසෙක්ස් විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පෝල් හුයුග් මැතිතුමා** විසින් කොළඹ අධිකරණ කලාපයේ විනිසුරුවරු 44 දෙනෙකු සඳහා දේශණයක් පවත්වන ලදී..

" සිද්ධි කළමනාකරණයේ මෑත කාලින සංවර්ධනයන්" යන මැයෙන් 2013.10.14 දින ක්වීන්ස්ලන්ඩ් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ජෝන් මුරී මැතිතුමා විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ශ්‍රවණාගාරයේදී කොළඹ අධිකරණ කලාපයේ විනිසුරුවරු සඳහා දේශණයක් පවත්වන ලදී.



# 12. පර්යේෂණ කාර්යයන්

## 01). සිවිල් නීති ක්‍රමය නවීකරණය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ

මෙම කාල පරිච්ඡේදය තුලදී ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය සම්බන්ධ සිවිල් නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් නිර්දේශ ඇතුලත් යාවත් කාලීන පර්යේෂණ පත්‍රිකාවක් සකස්කොට ගරු අගවිනිසුරුතුමා වෙත ඉදිරිපත් කරන ලදී. එකී ලේඛන පිළිබඳ තොරතුරු ආයතනයේ වෙබ් අඩවිය වන htpp://judgesinstitute.lk) වෙතින් ලබාගත හැකිය සිවිල් නීති ක්‍රමය නවීකරණය කිරීම සඳහා වු එකී නිර්දේශයන් හි සාරාංශය පහතින් සඳහන් කර ඇත.:

අ) වේගවත්ව සහ සාධාරණ අයුරින් නඩු කටයුතු පවත්වාගෙන යාම තහවුරු කිරීම.
ආ) නඩු කීමේදී වියදම් අඩු කිරීම සහ ප්‍රමාදය අවම කිරීම.
ඇ) අධිකරණ පදනම් වු හෝ අධිකරණයෙන් පරිබාහිර නිරවුල් කිරීම් සඳහා දිරිමත් කිරිම.
ඈ) ගැටලු විසඳීමේ විකල්ප ක්‍රම අනුගමනය කිරිමට පාර්ශවකරුවන් දිරිමත් කිරීම.
ඉ) ඵලදායි සිද්ධි කළමනාකරණ යාන්ත්‍රණයක් සඳහා ප්‍රමාදය වළක්වාලීමට වර්තමාන චර්යාවන් වැඩි දියුණු කිරිම.
ඊ) සිවිල් නිති ක්‍රමය තුල නව ව්‍යවස්ථාදායක, පරිපාටික රීති සහ සම්මතයන් හඳුන්වාදීම.
උ) අධිකරණ නීති කෘත්‍යයන්හිදි තාක්ෂණය භාවිතා කිරීම
ඌ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම
එ) ලියාපදිංචි තැපැල්, කුරියර් සේවාව හෝ ලේඛන සම්ප්‍රේෂණය කළ හැකි වෙනත් ඕනෑම මාධ්‍යයක් හරහා සිතාසි යැවිය හැකි ක්‍රම හඳුන්වාදීම ( ෆැක්ස් පණිවුඩ හෝ ඊ මේල් සේවාව පළමුවද සහ විත්තිකරුගේ පවුලේ වැඩිහිටි සාමාජිකයකු වෙත සිතාසි භාරදිමට සළකා බැලීම ද ඇතුලත්ව)
ඒ) විත්තිකරු විසින් උත්තර ගොනුකිරීම සම්බන්ධයෙන් කාල සීමාවක් හඳුන්වා දීම.
ඔ) පූර්ව නඩු විභාග කාර්ය පටිපාටිය හඳුන්වාදීම (අ) සුදුසු නඩු කටයුතු වලදී සමථ කොන්දේසි යෝජනා කිරීමට අධිකරණය වෙත ඇති අයිතිය ඇතුලත්ව නිරවුල් කිරීමට, සමථයකට හෝ වෙනත් එකඟතාවකට පිවිසීමට පාර්ශවයන්ට සහාය දැක්වීම (ආ) දැනට පවත්නා පනත් යටතේ ප්‍රජා සමථකරණ හෝ වානිජ සමථකරණ වැනි අධිකරණය විසින් සහාය ලබාදෙන හෝ අධිකරණය විසින් යොමු කරන ලද සමථකරණය මගින් ගැටුම් විසඳීමේ විකල්ප ක්‍රියාමාර්ගයකට එලඹීම (ඇ) නඩුව ජයග්‍රහණය කළ නොහැකි බවට අදාල පාර්ශවයට හැඟී යන්නේ නම් හෝ හිමිකම් ඉල්ලීම හෝ විසඳිය යුතු ප්‍රශ්ණය කහවුරු කර ඇත්නම් එවැනි අවස්ථාවක ලඝු නඩු තීන්දුව සඳහා වු මූලික නඩු විමසීම තවදුරටත් පුලුල් කළ යුතුය.
ඕ) මුල් දිවුරුම් ප්‍රකාශයෙන් ආවරණය නොකරණ නඩු විභාගයකදි දිව්රුම් ප්‍රකාශයක් ගොනු නොකිරීම හෝ නව කාරණාවන් පැන නොනගින අවස්ථාවකදී විනිසුරුතුමාට අභිමතය ක්‍රියාත්මක කිරීම පිණිස වන වෙනත් ආරක්ෂණ හා සීමාකිරීම් ලබා දීමට යටත්ව වාචික මුලික විභාගයේදී ලබා ගත යුතු දිව්රුම් ප්‍රකාශ ගත සාක්ෂි

ක) 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වානිජ සමථකරණ මධ්‍යස්ථාන පනත අවලංගු කොට නව වානිජ සමථකරණ මධ්‍යස්ථාන වෙත වානිජ ආරවුල් යොමු කිරීම සඳහා විධිවිධාන සැලසීම, අනෙකුත් ආරක්ෂිත රැකවරණ සහිතව පනත බලගැන්වීමේ යාන්ත්‍රණයක් සඳහා විධිවිධාන සැලැස්වීම.

ග) වානිජ සමථකරණය ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රතිපාදන සැලැස්වීම, සමථකරුවන් වශයෙන් නිතිඥයන් සහ අනෙකුත් වෘත්තිකයන් පුහුණුකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ කොළඹින් බැහැර ප්‍රදේශවල වානිජ ආරවුල් පලදායි ලෙස විසඳීම සඳහා වානිජ සමථකරණ ශාඛා පිහිටුවීම.

ඡ) හඳුනාගත් ප්‍රදේශ සම්බන්ධයෙන් සියලුම පළමු අවස්ථා අධිකරණ විසින්, අනුගමනය කළ යුතු ප්‍රායෝගික නියමයන් හඳුන්වා දීම.

ට) අධිකරණ නීති කෘතයන්හිදී නීතිඥයින්, විනිශ්චය කාරවරු සහ අධිකරණ කාර්ය මණ්ඩල සඳහා පරිගණක (ඩෙස්ක් ටෝප්, ලැප්ටොප්, ටැබ්ලට්) භාවිතයට ඉඩකඩ සලසා දීම මගින් පළමු අවස්ථා අධිකරණ වල තාක්ෂණය භාවිතා කිරීම(නඩු ප්‍රවාහ සහ දිනපතා සිදු කෙරෙන පියවරයන් පිළිබඳ දත්ත ඇතුලත් කිරීම සඳහා සහ සටහන් තැබීම, නඩු කැඳවීම, පරිශීලන අරමුණු සහ අධිකරන කාර්ය මණ්ඩල විසින් අධිකරණ නීති කෘත්‍යයන් වාර්තා කිරීමේදී ඒ සඳහා තාක්ෂණික උපකරණ (audio recording devices) භාවිතා කිරීමට ඉඩ ලබා දීම මගින්)

ඩ) මූලික වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වානිජ මහාධිකරණය සහ කොළඹ දිසා අධිකරණය සඳහා ඊ - ලිපිගොනු පද්ධති හඳුන්වාදීම

න) ප්‍රධාන වානිජ නගරයන්හි වානිජ මහාධිකරණ පිහිටුවීම.

ඉහතින් සඳහන් කළ නිර්දේශයන් කිහිපයක් සඳහා පහසුකම් සලසනු වස්, එකී යෝජනා කිහිපයක් ඇතුලත් කරමින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය විසින් සකස්කළ සිවිල් නඩු විධාන සංග්‍රහය සඳහා වූ සංශෝධිත කෙටුම්පත් ඉදිරිපත් කරන ලදී. එසේම එකී නිර්දේශයන් සඳහා කවදුරටත් පහසුකම් සැලසීම පිණිස 2000 අංක 44 දරන වානිජ සමථකරණ මධ්‍යස්ථාන පනත වෙනුවට 2005 අංක 37 දරන නව වානිජ සමථකරණ මධ්‍යස්ථාන සංශෝධන පනත සකස්කොට ගරු විනිසුරු තුමා වෙත ඉදිරිපත් කරන ලදී.

ඊට අමතරව ඉහත සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා මේ සමඟ ප්‍රායෝගික නියමයන් 3ක් ඉදිරිපත් කරන ලදී. මෙහි අරමුනු වන්නේ ප්‍රමාදයක් වළක්වා ගැනිමත් නිශ්චිත විශේෂ නඩු කටයුතු වලදි පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීමත් අධිකරණ කාර්ය මණ්ඩලය සහ නීතිඥයින් විසින් තාක්ෂණය භාවිතය සඳහාත්ය. එකී නියමයන් වන්නේ

- ❖ පවුල් ආරවුල් සම්බන්ධයෙන් ප්‍රායෝගික නියමය
- ❖ බෙදුම් නඩු සම්බන්ධයෙන් ප්‍රායෝගික නියමය
- ❖ අධිකරණ නීති කෘත්‍යයන්හිදී ඉලෙක්ට්‍රොනික උපාංග සහ ඉලෙක්ට්‍රොනික උපකරණ භාවිතය සම්බන්ධයෙන් වූ ප්‍රායෝගික නියමය.

අධිකරණ පද්ධතිය තුල සිදු කෙරෙන සිවිල් නීති ප්‍රතිසංස්කරණ
යෝජනා කිහිපයක් පිළිබඳ තෝරතුරු




## 2). විනිසුරුවරු පුහුණු කිරීමේ අත්පොත


ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ඉතිහාසයේ ප්‍රථම වතාවට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ඉල්ලීම මත විස්තීරණ පුහුණු අත්පොතක් සකස් කර ඇත. එහි පුහුණු පාඨමාලා, පුහුණුවේ අන්තර්ගතය, පුහුණු ක්‍රම සහ පුහුණු විෂය මාලාව පිළිබඳ විස්තර අන්තර්ගත කොට ඇත. ඒ සඳහා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව 2013 ජූනි මස පමණ වන විට එක් පුහුණු අත් පොතක් ප්‍රසිද්ධ කරනු ඇත.ආයතනයේ වෙබ් අඩවිය වන htpp://judgesinstitute.lk) වෙත පිවිසීමෙන් පුහුණු අත්පොත පිළිබඳ විස්තර ලබා ගත හැකිය. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය විසින් මුහුණ දිය යුතු අනාගත අභියෝග සැලකිල්ලට ලනිමින් ශ්‍රී ලංකාවේ අධිකරණ කිලධාරීන්ගේ වර්ධනීය පුහුණු අවශ්‍යතාවන්ට අනුකූළතාව දැක්වීම පිණිස විනිශ්චයකාරවරුන්ගේ ආයතනය විසින් මෙම දිගුකාලීන පුහුණු අත්පොත අධිකරණ නිලධාරීන් වෙනුවෙන් සැලසුම් කොට සංවර්ධනය කර ඇත. අත්පොත මගින් සිවිල් නීතිය, අපරාධ නීතිය, වානිජ නීතිය සහ පවුල් ආරවුල් පිළබඳ නිති වැනි හරවත් නීතිය පිළිබඳ තොරතුරු ගෙන හැර දක්වයි. ඊට අමතරව අධිකරණ පරිපාලනය, නඩු තින්දු නීතිය, නඩ තීණ්දු ප්‍රවාහ කළමනාකරණය, විකල්ප ආරවුල් විසඳීම, නිපුණතා සංවර්ධනය, පර්යේෂණ ක්‍රමවේදය, මානසික සහ ශාරිරික සෞඛ්‍යය, තොරතුරු තාක්ෂණය සහ අධිකරණ නිලධෘරීණ් සඳහා වැදගත් වන අනෙකුත් මාතෘකා පිළිබඳව තොරතුරුද මෙමගින් ගෙන හැර දක්වයි.

## 3). විනිශ්චයකාරවරුන්ගේ අත්පොත යාවත් කාලීන කිරීම.

පසුගිය වසර 20 පුරාවට විනිශ්චයකාරවරුන්ගේ අත්පොත යාවත්කාලීන කොට නොමැත. විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු රංජිත් රණරාජා උපදේශකතුමන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ මෙම අත් පොත් යාවත්කාලීන කිරිමේ කාර්ය සිදු කරගෙන යනු ලැබේ.

## 13 අන්තර්ජාතික සහයෝගිතාව

2014 නොවැම්බර් මස අධිකරණ පුහුණුව පිළිබඳ අන්තර්ජාතික සංවිධානයේ (IOJT) විධායක කමිටුවේ තිරණය මත ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය විසින් එම සංවිධානයේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී.



THE INTERNATIONAL ORGANIZATION FOR JUDICIAL TRAINING

IOJT

Certificate of Membership

Sri Lanka Judges' Institute

*Sri Lanka*

*Has been approved and registered as a member of the*

International Organization for Judicial Training

*by virtue of the decision of the Organization's Executive Committee*

*Signed*

Justice Eliezer Rivlin
*President*

Judge Yigal Mersel
*Secretary-General*

බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආධාරක DVD තැටි, පොත් සහ පුහුණු ග්‍රන්ථ සැපයීමෙ මගින් විනිශ්චයකාරවරුන්ගේ ආයතනය, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සහාය ලබා ගන්නා ලදී.



**අධිකරණ පුහුණුව සම්බන්ධයෙන් 2013 නොවැම්බර් මස වොෂිංටන් හි පැවති IOJT සමුළුව.**

2013 නොවැම්බර් මස ආයතනයේ නිලධාරීන්, ෆෙඩරල් අධිකරණ මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවූ අතර ආයතන දෙක අතර හවුල් ව්‍යාපරයක් ආරම්භ කිරීමේ හැකියාව පිළිබඳව එහිදී සාකච්ඡා කරන ලදී. එක්සත් ජනපදයේ ෆෙඩරල් අධිකරණ මධයස්ථානය විසින් පරිත්‍යාග කරන ලද සිද්ධි කළමනාකරණය සම්බන්ධයෙන් වූ පුහුණු ග්‍රන්ථ සහ ආධාරක DVD තැටි ගණනාවක් ආයතනය වෙත ලබාගන්නා ලදී.




**2013 නොවැම්බර් මස වොෂිංටන්හි ෆෙඩරල් අධිකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (පරිපාලන) සමඟ ආයතනයේ නිලධාරීන්**

## 14. අනාගත පාඨමාලා

- සිද්ධි කළමනාකරණය සහ සමථකරණය
- භාෂා පුහුණුව
- DNA සාක්ෂි
- අධිකරණ වෛද්‍ය විද්‍යාව
- උදර්පණ නීතිය
- නිෂේධනය සහ සමථකරණය
- අද්මිරාල්තිය නීතිය
- අභියාචනාධිකරණ රීති (අභියාචනා කාර්ය පිටිපාටිය)
- නඩු තීණ්දු ලිවිම
- දණ්ඩන නිර්නායක

## 15. වැදගත් ගිනුම්කරන ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා වරලත් ගණතාධිකාරි ආයතනය විසින් ස්ථාපිත කර ඇති පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම සහ ගිනුමකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත.

## 16. සුභාෂිංසනය

1. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සහ කාර්ය මණ්ඩලය
2. අධිකරණ සේවා කොමිෂන් සභාව
3. භාණ්ඩාගාර ලේකම් සහ එහි කාර්ය මණ්ඩලය
4. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන
5. විගණකාධිපතිතුමා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය
6. විණන අධිකාරි සහ ඔහුගේ කාර්ය මණ්ඩලය
7. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර්වරයා
8. අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා

ශ්‍රේෂ්ඨාධිකරණයේ මාර්ෂල්වරයා යන සියලුම දෙනා විසින් අප වෙත දක්වන ලද සහයෝගය සහ සහාය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වෙනුවෙන් කෘතඥ පූර්වකව සිහිපත් කරමි

රුවන් ප්‍රනාන්දු
මහාධිකරණ විනිසුරු සහ අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

2014 අගොස්තු 10 වන දින
ශ්‍රී ලංකාවේ කොළඹදීය

# 17. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 2013.12.31 දිනට ශේෂපත්‍රය

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය**
**2013.12.31 දිනට ශේෂපත්‍රය**

| | සටහන් | 2013 | | 2012 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| **වත්කම්** | 1 | | | |
| ජංගම නොවන වත්කම් | | | 6,047,338.40 | 536,298.76 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග (කාර්යාල ලිපිද්‍රව්‍ය) | | 8,000.00 | | 25,000.00 |
| ඉතිරිකිරීමේ ගිනුම් ශේෂය | | 247,300.99 | | 403,631.17 |
| 2012.12.31 දිනට මුදල් | | 156, 217.35 | | 501.04 |
| 2013.12.31 දිනට | | | 411,518.34 | |
| | | | 6,458,856.74 | 965,430.97 |
| **මූලධනය වන්නේ** | | | | |
| සමුච්චිත අරමුදල | | 4,302,360.93 | | 5,929,170,76 |
| එකතුකලා/(අඩුකලා),අතිරික්තය(ඌනතාව) | 5 | 2,131,220.81 | 6,433,581.74 | (5,340,625,79) |
| **ජංගම වගකීම** | | | | |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | | 24,800.00 | | 92,000.00 |
| මුද්දර බදු සඳහා ප්‍රතිපාදන | | 475.00 | 25,275.00 | 284,886.00 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත උපචිත වියදම් | | | 6,458,856.74 | 965,430.97 |

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කොට ඇත්තේ ගිනුම්කරණ මූලධර්ම වලට අනුකූලවය.

...............................
සකස්කලේ
ජී. මද්දෙගොඩගේ මහතා
ගණකාධිකාරි (වැ.බ.)
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

.................................
ගරු එම්.ආර්.සී. ප්‍රනාන්දු
අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

## 18. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 2013.12.31 දිනට අවසන් වසර සඳහා ආදායම් සහ වියදම් ගිණුම

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
2013.12.31 දිනට අවසන් වසර සඳහා ආදායම් සහ වියදම් ගිණුම

| | | (රු) | | (රු.) |
|---|---|---|---|---|
| | සටහන් | 2013 | | 2012 |
| | | රු. | රු. | රු. |
| **ආදායම** | | | 10,303,501.87 | 894,802.98 |
| අමාත්‍යාංශයෙන් ලද අග්‍රිමය | | | 11,470.32 | 15,843.08 |
| ඉතිරිකිරීමේ ගිණුම් වෙතින් ලද පොලි ආදායම | 06 | | 8,592.00 | - |
| ණයා පිටපත් ගාස්තු ආදායම | | | 4,000.00 | - |
| නවාතැන් පහසුකම් ගාස්තු | | | 2,000.00 | - |
| ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් ලද මුදල් | | | 10,329,564.19 | 910,646.06 |
| මුලු ආදායම | | | | |
| **අඩුකලා - වියදම්** | | | | |
| | | 511,866.57 | | |
| වැටුප් හා වේතන (සේඅප/සේභාඅ සහිතව) | | 70,723.82 | | 888,081.24 |
| අතිකාල | | 3,133,800.00 | | 77,234.90 |
| සම්මන්ත්‍රන සහ පුහුණු වැඩසටහන් සඳහා | | 468,890.58 | | 3,316,050.00 |
| දීමනා | | 167,800.00 | | 180,701.40 |
| කාර්යාල ලිපිද්‍රව්‍ය වියදම් | | 2,240.00 | | - |
| විශ්‍රාම පාරිතෝෂිතය | | 153,915.40 | | - |
| ගමන් වියදම් | | 4,000.00 | | 262,500.00 |
| ඉන්ධන | | 126,361.24 | | 13,640.00 |
| නිල ඇඳුම් දීමනා | | 53,083.25 | | - |
| අනෙකුත් සැපයුම් | | 151,297.38 | | 535,498.27 |
| වාහන නඩත්තු | | 495,692.68 | | - |
| යන්ත්‍රාගාර යන්ත්‍ර සහ උපකරණ නඩත්තුව | | 2,299,527.00 | | 232,669.88 |
| තැපැල් සහ සන්නිවේදනය/අන්තර්ජාල | | 3,000.00 | | 232,767.00 |
| සනිපාරක්ෂක සේවාව සමග අනෙකුත් සේවා | | | | 750.00 |
| බැංකු ගාස්තු | | 556,144.96 | | |
| | | - | | 12,555.25 |
| ක්ෂය සඳහා වෙන් කිරීම | 01 | - | | 195,000.00 |
| දේශන සඳහා දීමනා | | - | | 299,323.91 |
| ධාවන වියදම් | | | | 4,500.00 |
| සේවක මණ්ඩල සුභසාධනය | | | | |
| සමුච්චිත අරමුදල සඳහා අතිරික්තය / | | | (8,198,343.38) | |
| (ඌණතාවය) | | | 2,131,220.81 | (5,340,625.79) |

## 19 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
## 201 3.12.31 දිනට අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් | 2013 | | 2012 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| <u>**මෙහෙයුම් කටයුතු**</u> | | | | |
| අමාත්‍යාංශයෙන් ලද අග්‍රිමය | | 10,303,501.87 | | 894,802.98 |
| ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආපසු ගෙවීම | 06 | 2,000.00 | | - |
| ඡායා පිටපත් ගාස්තු ආදායම | | 8,592.00 | | - |
| නැවතීමේ පහසුකම් සඳහා ගාස්තු | | 4,000.00 | 10,318,093.87 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ගාස්තු | | | | |
| | | 7,525,122.92 | | 6,293,213.10 |
| | | 2,636,753.60 | (10,161,876.52) | 191,272.25 |
| | | | 156,217.35 | (5,589,682.37) |
| | 02 | | | |
| මෙහෙයුම් කටයුතු වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය | | | | |
| | 03 | 11,470.32 | | |
| | | (11,470.32) | | 15,843.08 |
| | | | 0.00 | (15,843.08) |
| <u>**ආයෝජන කටයුතු**</u> | | | | |
| ඉතුරුම් ගිනුමේ පොලිය | | | | |
| ඉතුරුම් ගිනුමේ පොලිය නැවත ආයෝජනය කිරීම | | | | |
| ආයෝජන කටයුතු වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 0.00 | |
| මුදල්/මුදල් හා සමාන දෑ වල ශුද්ධ ඉහළ යාම/(පහළයාම) | | | 156,217.35 | |
| | | | | 5,590,183.41 |
| වර්ෂය ආමර්භයේදී මුදල්/ මුදල් හා සමාන දෑ | | | | |
| | | | 156,217.35 | 501.04 |
| වර්ෂය අවසානයේදී මුදල් / මුදල් හා සමාන දෑ | | | | |

සටහන 01

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
## ජංගම නොවන වත්කම්.

| විස්තරය | වර්ෂය ආරම්භයේදී පිරිවැය | වර්ෂය සඳහා එකතු කිරීම | වර්ෂය සඳහා ක්ෂය වෙන් කිරීම් | 2013.12.31 දිනට සමුච්චිත ක්ෂය | ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|
| කාර්යාල උපකරණ | 444,005.00 | 758,602.09 | 89,988.59 | 407,744.09 | 794,863.00 |
| ලී බඩු | 1,141,549.50 | 627,390.51 | 117,683.32 | 188,186.81 | 1,580,753.20 |
| පුස්තකාල පොත් | 111,989.85 | 239,000.00 | 13,626.06 | 91,090.91 | 259,898.94 |
| පරිගණක උපකරණ | 3,044,496.00 | 695,515.00 | 316,041.51 | 507,890.51 | 3,232,120.49 |
| විදුලි උපකරණ | 85,639.00 | 31,360.00 | 10,654.56 | 10,654.56 | 106,344.44 |
| භෝජන සංග්‍රහ උපකරණ | 61,409.25 | | 6,140.92 | 6,140.92 | 55,268.33 |
| ගමන් මලු | 20,100.00 | | 2,010.00 | 2,010.00 | 18,090.00 |
| | 4,909,188.60 | 2,351,867.60 | 556,144.96 | 1,213,717.80 | 6,047,338.40 |

**2013 වර්ෂය සඳහා ක්ෂය වෙන් කිරීම**

| | | | |
|---|---|---|---|
| 2013.01.01 | කාර්යාල උපකරණ | 444,005 X 10% | 44,400.50 |
| 2013.04.30 | අත්පත් කර ගැනීම | (556,233.09 X 10%) X 9/12 | 41,717.48 |
| 2013.06.26 | අත්පත් කර ගැනීම | (9,184 X 10%) X 6/12 | 459.20 |
| 2013.09.02 | අත්පත් කර ගැනීම | (11,500 X 10%) X 4/12 | 383.33 |
| 2013.10.14,21 | අත්පත් කර ගැනීම | (181,685 X 10%) X 2/12 | 3,028.08 |
| 3,028.08 | | | |
| | | | 89,988.59 |

| | | | |
|---|---|---|---|
| 2013.01.01 | ලී බඩු | 1,141,549.50 X 10% | 114,154.95 |
| 2013.10.30 | අත්පත් කර ගැනීම | (211,702.40 X 10%) X 2/12 | 3,528.37 |
| 2013.12.11,20 | අත්පත් කර ගැනීම | (415,688.11 X 10%) X 0/12 | - |
| | | | 117,683.32 |

| | | | |
|---|---|---|---|
| 2013.01.01 | පුස්තකාල පොත් | 111,989.85 X 10% | 11,198.98 |
| 2013.10.08 | අත්පත් කර ගැනීම | (72,250 X 10%) X 2/12 | 1,204.16 |
| 2013.11.19 | අත්පත් කර ගැනීම | (146,750 X 10%) X 1/12 | 1,222.92 |
| 2013.12.11 | අත්පත් කර ගැනීම | (20,000 X 10%) X 0/12 | - |
| | | | 13,626.06 |

| | | | |
|---|---|---|---|
| 2013.01.01 | පරිගණක උපකරණ | 3,044,496.00 X 10% | 304,449.60 |
| 2013.10.08 | අත්පත් කර ගැනීම | (695,515 X 10%) 2/12 | 11,591.91 |
| | | | 316,041.51 |

| | | | |
|---|---|---|---|
| 2013.01.01 | විදුලි උපකරණ | (85,693 X10%) | 8,563.90 |
| 2013.04.29 | අත්පත් කර ගැනීම | (31,360 X10%) X 8/12 | 2,090.66 |
| | | | 10,654.56 |

**සටහන 02 - මෙහෙයුම් කටයුතු සම්බන්ධ වියදම්**

| | |
|---|---|
| වැටුප් හා වේතන | 511,866.57 |
| ගමන් වියදම් | 2,240.00 |
| අතිකාල ගෙවීම් | 70,723.82 |
| ලිපිද්‍රව්‍ය | 451,890.58 |
| ඉන්ධන | 153,915.40 |
| නිල ඇඳුම් | 5,000.00 |
| අනෙකුත් සැපයුම් | 126,361.24 |
| දීමනා (සම්මන්ත්‍රණ සහ පුහුණුව) | 3,133.800.00 |
| වාහන නඩත්තුව | 53,083.25 |
| යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ උපකරණ නඩත්තුව | 151,297.38 |
| තැපැල් සහ සන්නිවේදනය | 495,692.68 |
| අනෙකුත් සේවාවන් | 2,299,527.00 |
| බැංකු ගාස්තු | 3,000.00 |
| විගණන ගාස්තු | 67,200.00 |
| | 7,525.597.92 |
| (-) මුද්දර බදු සඳහා වෙන් කිරීම | (475.00) |
| | 7,525, 122.92 |

**සටහන 03 –**

| | |
|---|---|
| කාර්යාල ලී බඩු සහ උපකරණ අත්පත් කරගැනීම | 2,081,507.60 |
| යන්ත්‍රාගාර, යන්ත්‍ර අත්පත් කර ගැනීම | 31,360.00 |
| පුස්තකාල පොත් අත්පත් කර ගැනීම | 239,000.00 |
| පරිගණක සර්වර් සඳහා ගෙවීම | 284,886.00 |
| | 2,636,753.60 |

**සටහන - 04**

සෘජු ක්‍රමය මත සකස් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**සටහන 05 - සමුච්චිත අරමුදල සඳහා ගැලපුම්**

| | | | |
|---|---|---|---|
| 2013.01.01 දිනට ශේෂය | | | 588,544.97 |
| ගැලපුම | (I) | 2012.12.31 දිනට දෝෂ සහිත මුදල් ශේෂය | (501.04) |
| | | | 588,043.93 |
| | (11) | පසුගිය වර්ෂයේ නිල ඇඳුම් දීමනා | (1,000.00) |
| | | | 587,043.93 |
| | (111) | අමාත්‍යාංශය වෙතින් ලද වත්කම් | 3,715,317.00 |
| | | | 4,302,360.93 |

**සටහන 06**

**I. අමාත්‍යාංශය වෙතින් ලද අග්‍රිමය**

| | |
|---|---|
| ජනවාරි | 1,744,176.78 |
| මාර්තු | 878,698.31 |
| අප්‍රේල් | 1,087,593.09 |
| ජුනි | 918,379.91 |
| ජුලි | 800,000.00 |
| සැප්තැම්බර් | 1,963.514.78 |
| ඔක්තෝබර් | 1,491,139.00 |
| නොවැම්බර් | 100,000.00 |
| දෙසැම්බර් | 1,320,000.00 |
| | 10,303,501.87 |

**II. ණයා පිටපත් ගාස්තු**

| | |
|---|---|
| පෙබරවාරි | 2,516.00 |
| මාර්තු | 1,603.00 |
| මැයි | 120.00 |
| ජුනි | 1,175.00 |
| ජුලි | 1,498.00 |
| අගෝස්තු | 140.00 |
| සැප්තැම්බර් | 108.00 |
| ඔක්තෝබර් | 1,020.00 |
| නොවැම්බර් | 340.00 |
| දෙසැම්බර් | 72.00 |
| | 8,592.00 |

**III. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතිපූර්ණය කිරීම**

| | |
|---|---|
| සැප්තැම්බර් | 2,000.00 |

**IV. නවාතැන් පහසුකම් සඳහා ගාස්තු**

| | |
|---|---|
| දෙසැම්බර් | 4,000.00 |

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | සංචිත අරමුදල් | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිත | එකතුව (රු) |
|---|---|---|---|---|---|
| 2013.01.01 දිනට ශේෂය | | | | | 4,302,360.93 |
| වර්ෂය සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන | | | | | |
| වර්ෂය තුලදී අතිරික්ත හිඟය | | | | | 2,131,220.81 |
| | | | | | |
| 2013.12.31 දිනය ශේෂය | | | | | 6,433,581.74 |

ජී. මැද්දගොඩගේ
ගණකාධිකාරි (වැඩ බලන)
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

ගරු එම්.ආර්.සී. ප්‍රනාන්දු
අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

# 20. 2013.12.31 දිනට ස්ථාවර වත්කම්

**ස්ථාවර වත්කම් ලේඛනය අනුව**

# 21. විගණකාධිපතිතුමාගේ වාර්තාව - 2013

## විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ජේපී/සී/එස්එල්ජේඅයි/ 01/13/06 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2014 නොවැම්බර් 28 දින |

අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතන පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2014 නොවැම්බර් 20 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. · No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

2

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ආයතනය සතු කාර්යාල උපකරණ, ලී බඩු, පුස්තකාල පොත්, පරිගණක, පරිගණක උපාංග සහ විදුලි විෂයයන් ඇතුළු සියළු වත්කම්, එම වත්කම්වල ඵලදායී ජීව කාලය සැලකීමෙන් තොරව වර්ෂයකට සියයට 10 බැගින් ක්ෂය කර තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) මුදල් රෙගුලාසි | |
| i. මුදල් රෙගුලාසි 228 | අදාළ වියදම් ගිණුම පිළිබඳ විස්තර ගෙවීම් වවුචර්වල මතු පිට සඳහන් කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 1646 | ආයතනයේ සංචිත වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) චක්‍රලේඛ විධිවිධාන | |
| 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස්./1 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛයේ 3.1 වගන්තිය. | ආයතනය විසින් පුස්තකාල පොත්වලට අදාළව වාර්ෂික සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද, ඒ අනුව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම්වල ප්‍රතිඵලය රු. 2,131,221 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.5,340,626 ක ඌනතාවයක් වූ හෙයින් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵල රු. 7,471,847 ක වර්ධනයක් දැක්වුණි. මුළු වියදම රු. 1,947,071 කින් වැඩි වුවද, වර්ෂය සඳහා ලැබීම් රු. 9,418,918 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ ක්‍රියාකාරි සැලැස්මේ භෞතික හා මූල්‍ය ඉලක්කයන් දක්වා තිබුණද, මූල්‍ය කාර්යසාධනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ii. ආයතනයේ භෞතික කාර්යසාධනය අනුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉලක්කයන් ඉටු කර ගැනීම පහත දැක්වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

4

| ක්‍රියාකාරී සැලැස්ම අනුව විෂය අංකය | විස්තරය | ඉලක්කයන් මූල්‍ය රු | ඉලක්කයන් භෞතික | ඉටුකර ගැනීම |
|---|---|---|---|---|
| 01 | අලුතෙන් පත්වූ විනිශ්චයකාරවරුන් සඳහා පුහුණු වැඩසටහන් | 1,500,000 | විනිශ්චයකාරවරුන් 30 | පවත්වා නොතිබුණි |
| 03 | කම්කරු උසාවි සභාපතිවරුන් සඳහා පුහුණු වැඩසටහන් (Wi-Fi අන්තර්ජාල පහසුකම්) | 808,000 | කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් 385 ක් | කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් 105 ක් පමණක් පුහුණු කරන ලදී. |
| 05 | දේශන ශාලාව සඳහා සේදුම් කාමර (wash rooms) ඉදිකිරීම. | 1,000,000 | කාමර 2 | ඉදිකර නැත. |
| 08 | පරිගණක හා වෙබ් අඩවි පදනම් පර්යේෂණ පාඨමාලා | 100,000 | පාඨමාලා 20 | පවත්වා නැත. |

ඉහත තොරතුරු අනුව, ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ඉලක්කයන් ඉටුකර ගැනීම ඉතා දුර්වල මට්ටමක වූ බව අනාවරණය විය.

5 **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතන පනතේ 10(4) වගන්තිය අනුව, මුදල් වර්ෂය අවසන් වී මාසයක් ඇතුළත එක් එක් මුදල් වර්ෂය සඳහා ආයතනයේ ගිණුම් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2014 ජූනි 10 දින දිය.

6 **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

අ. ගිණුම්කරණය
ආ. සැලසුම් කිරීම

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)